

2025 - 2026

ANNUAL REPORT

Maliyadeva College Old Boys Association



දික්වෙළ පියනන්ද හිමි විසින් ප්‍රදානය කළ
දැනට බුදු මැදුරේ තැන්පත් කර ඇති කිරිගරුඬ බුදු පිළිමය


මලියදේව විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමයේ
88 වන සංවත්සරික මහා සභාව 2026.09.20
මුලසුන - ගරු ක්‍රියාකාරී සභාපති ඉංජිනේරු ධම්මික තන්තිරිමලගේ මහතා
න්‍යාය පත්‍රය

- පන්සිල් සමාදන්වීම
- ජාතික ගීය ගායනා කිරීම
- පාසල් ගීතය ගායනා කිරීම
- විද්‍යාලයේ ආරම්භකයන්,/ ප්‍රභූන් සහ අභාවප්‍රාප්ත සාමාජිකයන් සිහිපත් කිරීම
- පිළිගැනීමේ කථාව - ගරු ක්‍රියාකාරී සභාපති
- නොපැමිණි අයගේ ලිපි, පණිවුඩ කියවීම (ගරු සමලේකම්වරයෙක්)
- පසුගිය සංවත්සරික මහ සභා රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම (ගරු සමලේකම්වරයෙක්)
- වාර්තාව පිළිගැන්වීම, සාකච්ඡා කිරීම හා සම්මත කිරීම
- වාර්තාවලින් පැනනගින කරුණු සාකච්ඡා කිරීම
- වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම (ගරු සමලේකම්වරයෙක්)
- ශිෂ්‍යත්ව අරමුදල් පිළිබඳ වාර්ෂික වාර්තා, වාර්ෂික ශිෂ්‍යත්වලාභීන්ගේ ශිෂ්‍යත්ව වාර්තා ඉදිරිපත් කිරීම (ගරු සමලේකම්වරයෙක්)
- වෙනත් වාර්තා, ශාඛා තොරතුරු ආදිය ඉදිරිපත් කිරීම
- වාර්ෂික අයවැය ලේඛනය හා ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම (ගරු භාණ්ඩාගාරික)
- අයවැය පිළිගැනීම, සාකච්ඡා කිරීම හා සම්මත කිරීම
- නව සාමාජික ලැයිස්තුව ඉදිරිපත් කිරීම - (ගරු සමලේකම්වරයෙක්)
- අභාවයට පත් සාමාජිකයන්ගේ නම් ප්‍රකාශයට පත් කිරීම - (සාමාජිකත්වයෙන් ඉවත් කිරීම)
- විද්‍යාලය පිළිබඳ තොරතුරු දැන්වීම (ගරු විදුහල්පතිතුමා)
- කල් දී ඇති යෝජනා, ලිපි හා අදහස් සාකච්ඡා කිරීම සහ සම්මත කිරීම
- මුලසුන කථාව - ගරු ක්‍රියාකාරී සභාපති
- ස්තූති කථාව - ගරු සමලේකම්වරයෙක්
- නිලධාරීන් තනතුරුවලින් ඉවත් වීම
- තාවකාලික ගරු ක්‍රියාකාරී සභාපති පත්වීම
- ප්‍රථමයෙන් ගරු සමලේකම්වරුන් පත් කිරීම
- දෙවනුව ගරු ක්‍රියාකාරී සභාපති පත් කිරීම
- අභිනව ගරු ක්‍රියාකාරී සභාපති මූලාසනය හෙබවීම
- ගරු අනුශාසක මණ්ඩලය පත් කිරීම
- ව්‍යවස්ථාවට අනුකූලව ඉතිරි විධායක කමිටු සාමාජිකයන් සහ අනෙකුත් කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් පත් කිරීම
- ඉදිරි වර්ෂය සඳහා අවසන් කෘත්‍යාධිකාරී මණ්ඩලයේදී පත් කරගත් වරලත් විගණන ආයතනය පිළිබඳ දැනුම් දීම.
- වෙනත් කරුණු
- නව ගරු ක්‍රියාකාරී සභාපති සභාව ඇමතීම

ආදි ශිෂ්‍ය සංගමය

නම	**:**	**මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය**
Name	:	Maliyadeva College Old Boys Association
ලිපිනය	**:**	**මීගමු පාර, කුරුණෑගල.**
Address	:	Negombo Road, Kurunegala.
දුරකථනය /Telephone	:	037 2220185 / 037 2225185
වට්ස්ඇප් / Whatsapp	:	076 8376005
විද්‍යුත් තැපෑල /e-mail	:	devansoba@gmail.com
වෙබ් අඩවිය / website	:	www.maliyadevaoba.lk

සංස්ථාපිත දිනය /Incorporated Date : 247 (1983.5.25)



181477

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 247—1983 මැයි 25 වැනි බදාදා - 1983.05.25

1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 31 (9) (අ) වගන්තිය යටතේ නියමය

1979 අංක 28 දරණ දේශීය අදායම් පනතේ 31 (9) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මූල්‍ය හා ක්‍රම සම්පාදන මැඩිබලපෑ අමාත්‍ය මෙසාමූ ගනිපෑ, මහාමදු නහින මිරිස්කාර් වූනා මම, මීට යා කොට ඇති උපලේඛනයෙහි සඳහන් ආයතන එකී වගන්තියේ කාර්ය සඳහා පිළිගත් ප්‍රශ්නායතනයන් යැයි මෙයින් ඇන්විමෙමින් ප්‍රකාශ කරමි.

එම්. එච්. එම්. නසීබා මිලිත්කාර්,
මූල්‍ය හා ක්‍රම සම්පාදන මැඩිබලපෑ අමාත්‍ය.

1983. මැයි මස 10 දින,
කොළඹ දීය.

උපලේඛනය

1. කු/මලියදේව පිරිමි විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ "මලියදේව සංවර්ධන අරමුදල".

5-418 - 83/05.25 දින අංක 247 දරණ ගැසට් පත්‍රය.

හැඳින්වීම

වර්ෂ 1936 ක් වූ ජූලි මස 13 වන දින මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය වත්මන් විදුහල් පරිශ්‍රයේ දී අතිපූජ්‍ය නැකැත්තේ ආනන්ද හිමිපාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ගරු යූ.බී. වන්නිනායක මැතිතුමාගේ සභාපතීත්වයෙන් ආරම්භ කරන ලදී. ආරම්භක ගරු ලේකම් ලෙස ඩබ්.එම්. ගුණසේකර මැතිතුමා ද ගරු භාණ්ඩාගාරික ලෙස ඊ.එස්. බාලසූරිය මැතිතුමාද කටයුතු කරන ලදී. එතැන් පටන් අප වෙත නායකත්වය දුන් නිල මඩුල්ල පහත දැක්වේ.

වර්ෂය	හිටපු සභාපතිවරු	හිටපු සමලේකම්වරු	හිටපු සමලේකම්වරු	හිටපු භාණ්ඩාගාරිකවරු
1936-1938	යූ.බී. වන්නිනායක	ඩබ්.එම්. ගුණසේකර		ඊ.එස්. බාලසූරිය
1938-1944	යූ.බී. වන්නිනායක	ඩී.බී. ඉලංගකෝන්		ඊ.එස්. බාලසූරිය
1944-1949	යූ.බී. වන්නිනායක	ඩබ්.එම්. නන්දිසේන		ඊ.එස්. බාලසූරිය
1949-1950	ඩී.බී. තෙවරප්පෙරුම	ඩබ්.එම්. නන්දිසේන	මයුර බලල්ල	ඊ.එස්. බාලසූරිය
1950-1953	ඩී.බී. තෙවරප්පෙරුම	ඩබ්.එම්. නන්දිසේන	ටී.බී. ජයසේකර	ඊ.එස්. බාලසූරිය
1953-1954	ඩී.බී. දිසානායක	ඩබ්.එම්. නන්දිසේන	ටී.බී. ජයසේකර	ඊ.එස්. බාලසූරිය
1954-1961	ඊ.ඒ. පෙරේසිංහ	මයුර බලල්ල	ටී.බී. ජයසේකර	එන්.ජේ. ද තාබරෑ
1961-1962	ඩී.බී. දිසානායක	මයුර බලල්ල	ටී.බී. ජයසේකර	එන්.ජේ. ද තාබරෑ
1962-1964	ඩී.බී. දිසානායක	එච්.ඒ. ධර්මසේන	එච්.ඩී. හර්මන් පෙරේරා	එන්.ජේ. ද තාබරෑ
1964-1966	ඩී.බී. දිසානායක	එච්.ඒ. ධර්මසේන	එච්.ඩී. හර්මන් පෙරේරා	විල්සන් ජයසිංහ
1966-1967	ඒ. ජයතිලක	කමල් හේරත්	එච්.ඩී. හර්මන් පෙරේරා	විල්සන් ජයසිංහ
1967-1968	එම්.බී. පෙතියාගොඩ	කමල් හේරත්	එච්.ඩී. හර්මන් පෙරේරා	විල්සන් ජයසිංහ
1968-1970	එම්.බී. පෙතියාගොඩ	ඩී.ආර. දිසානායක	එච්.ඩී. හර්මන් පෙරේරා	විල්සන් ජයසිංහ
1970-1975	ඩී.බී. දිසානායක	එච්.ඒ. ධර්මසේන	එච්.ඩී. හර්මන් පෙරේරා	විල්සන් ජයසිංහ
1975-1978	ඊ.එස්. බාලසූරිය	එච්.ඒ. ධර්මසේන	එච්.ඩී. හර්මන් පෙරේරා	විල්සන් ජයසිංහ
1978-1979	ඊ.එස්. බාලසූරිය	එච්.ඒ. ධර්මසේන	සනත් පතිරණ	බී.එම්.ඒ. මුනමලේ
1979-1980	ඊ.එස්. බාලසූරිය	එච්.ඒ. ධර්මසේන	සනත් පතිරණ	බී.එම්.ඒ. මුනමලේ
1980-1981	ඊ.එස්. බාලසූරිය	එච්.ඒ. ධර්මසේන	එච්.ඩී. හර්මන් පෙරේරා	බී.එම්.ඒ. මුනමලේ
1981-1982	ඊ.එස්. බාලසූරිය	පී.සී. රත්නමලල	එච්.ඩී. හර්මන් පෙරේරා	සී.බී. දිසානායක
1982-1983	ජේ. ලංකාතිලක	දයා ගුණවර්ධන	එස්.බී. ආරඹේපොල	සී.බී. දිසානායක
1983-1984	ජේ. ලංකාතිලක	දයා ගුණවර්ධන	එස්.බී. ආරඹේපොල	සී.බී. දිසානායක
1984-1985	ජේ. ලංකාතිලක	දයා ගුණවර්ධන	එස්.බී. ආරඹේපොල	සී.බී. දිසානායක
1985-1986	ජේ. ලංකාතිලක	ජේ.බී. දිසානායක	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	සී.බී. දිසානායක
1986-1987	ජේ. ලංකාතිලක	ජේ.බී. දිසානායක	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	ටී.එම්.එල්. තෙන්නකෝන්
1987-1988	කේ.ජී. නිහාල්නන්ද	රංජිත් බක්මීවැව	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	ටී.එම්.එල්. තෙන්නකෝන්
1988-1989	කේ.ජී. නිහාල්නන්ද	රංජිත් බක්මීවැව	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	ටී.එම්.එල්. තෙන්නකෝන්
1989-1990	කේ.ජී. නිහාල්නන්ද	රංජිත් බක්මීවැව	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	ටී.එම්.එල්. තෙන්නකෝන්
1990-1991	චන්ද්‍රා ජයසේකර	ජේ.බී. ඇහැලේපොල	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	ටී.එම්.එල්. තෙන්නකෝන්
1991-1992	චන්ද්‍රා ජයසේකර	ජේ.බී. ඇහැලේපොල	ආර්.එම්.සී.පී.කේ.රත්නායක	ටී.එම්.එල්. තෙන්නකෝන්
1992-1993	චන්ද්‍රා ජයසේකර	ජේ.බී. ඇහැලේපොල	කේ.එම්.ටී. කෝණාර	ටී.එම්.එල්. තෙන්නකෝන්
1993-1994	එස්.බී. මඩවල	ජේ.බී. ඇහැලේපොල	කේ.එම්.ටී. කෝණාර	ටී.එම්.එල්. තෙන්නකෝන්
1994-1995	මංගල රණරාජා	හිල්ඩන් හමන්ගොඩ	කේ.එම්.ටී. කෝණාර	ටී.එම්.එල්. තෙන්නකෝන්
1995-1996	මංගල රණරාජා	ගාමිණී මන්චනායක	රංජිත් ජයවර්ධන	ටී.එම්.එල්. තෙන්නකෝන්
1996-1997	මංගල රණරාජා	ගාමිණී මන්චනායක	රංජිත් ජයවර්ධන	ටී.එම්.එල්. තෙන්නකෝන්
1997-1998	මංගල රණරාජා	ශාන්ති ද සිල්වා	ඕ.එස්. පෙරේරා	ටී.එම්.එල්. තෙන්නකෝන්
1998-1999	සුනිල් තෙන්නකෝන්	ශාන්ති ද සිල්වා	රංජිත් ජයවර්ධන	ටී.එම්.එල්. තෙන්නකෝන්
1999-2000	සුනිල් තෙන්නකෝන්	ශාන්ති ද සිල්වා	රංජිත් ජයවර්ධන	ටී.එම්.එල්. තෙන්නකෝන්
2000-2001	සුනිල් තෙන්නකෝන්	එන්.එස්.කේ. විජේනායක	එච්.එම්.යූ.එන්. ගුනතිලක	ටී.එම්.එල්. තෙන්නකෝන්
2001-2002	සුනිල් තෙන්නකෝන්	එන්.එස්.කේ. විජේනායක	එච්.එම්.යූ.එන්. ගුනතිලක	ටී.එම්.එල්. තෙන්නකෝන්
2002-2003	කමල් ජයසිංහ	එන්.එස්.කේ. විජේනායක	එච්.එම්.යූ.එන්. ගුනතිලක	ගාමිණී ස්වර්ණපාල
2003-2004	කමල් ජයසිංහ	ගාමිණී ස්වර්ණපාල	එච්.එම්.යූ.එන්. ගුනතිලක	සේනක විජේකෝන්
2004-2005	කමල් ජයසිංහ	ගාමිණී ස්වර්ණපාල	එච්.එම්.යූ.එන්. ගුනතිලක	සේනක විජේකෝන්
2005-2006	ගාමිණී ස්වර්ණපාල	එස්. කහදවාරච්චි	එච්.එම්.යූ.එන්. ගුනතිලක	සේනක විජේකෝන්

වර්ෂය	හිටපු සභාපතිවරු	හිටපු සමලේකම්වරු	හිටපු සමලේකම්වරු	හිටපු භාණ්ඩාගාරිකවරු
2006-2007	ගාමිණි ස්වර්ණපාල	ඩී.සී.පී. කුමාරසිංහ	රංජිත් ජයවර්ධන	සේනක විජේකෝන්
2007-2008	සුනිල් තෙන්නකෝන්	පී.සී. රත්නමලල	එච්.එල්.එච්.ආර්. ද සිල්වා	රෝහණ පුෂ්පලාල්
2008-2009	පී.සී. රත්නමලල	ප්‍රසංග රත්නායක	එච්.එල්.එච්.ආර්. ද සිල්වා	රෝහණ පුෂ්පලාල්
2009-2010	ගාමිණි ස්වර්ණපාල	සමන් ජයසිංහ	එච්.එල්.එච්.ආර්. ද සිල්වා	කිත්සිරි දොඩම්ගොඩ
2010-2011	ගාමිණි ස්වර්ණපාල	සමන් ජයසිංහ	එච්.එල්.එච්.ආර්. ද සිල්වා	කිත්සිරි දොඩම්ගොඩ
2010-2011	චන්දන ගුරුගේ	සමන් ජයසිංහ	ඩබ්.එම්.ටී.බී. විජේකෝන්	කිත්සිරි දොඩම්ගොඩ
2011-2012	චන්දන ගුරුගේ	ෂමීන් ජයතුංග	දම්නිද බණ්ඩාර	ප්‍රියංකර ලියනගේ
2012-2013	චන්දන ගුරුගේ	ෂමීන් ජයතුංග	ඩබ්.එම්.ටී.බී. විජේකෝන්	සුජීව රත්නායක
2013-2014	චන්දන ගුරුගේ	ෂමීන් ජයතුංග	ඩබ්.එම්.ටී.බී. විජේකෝන්	සුජීව රත්නායක
2014-2015	ලක්ෂ්මන් වේඩරුව	එන්.එස්.කේ. විජේනායක 2014/09/07-2015/04/05	අජිත් ෆර්ඩිනන්ඩස්	සුජීව රත්නායක
2014-2015	ලක්ෂ්මන් වේඩරුව	ඩුලිප් වීරතුංග 2015/04/05-2015/09/20	අජිත් ෆර්ඩිනන්ඩස්	සුජීව රත්නායක
2015-2016	ලක්ෂ්මන් වේඩරුව	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	ඩුලිප් වීරතුංග
2016-2017	ලක්ෂ්මන් වේඩරුව	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	යුරාජ් සරත්චන්ද්‍ර 2016/11/10-2017/03/12
2016-2017	ලක්ෂ්මන් වේඩරුව	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	සාලුක සෙනරත් 2017/03/12-2017/08/20
2017-2018	ධම්මික තන්තිරිමලගේ	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	ජයන්ත අභයරත්න
2018-2019	ධම්මික තන්තිරිමලගේ	උපුල් ගුණතිලක	චලින්ද ඉලංකෝන්	ජයන්ත අභයරත්න 2018/07/29-2018/11/17
2018-2019	ධම්මික තන්තිරිමලගේ	උපුල් ගුණතිලක 2018/07/29-2019/02/17	චලින්ද ඉලංකෝන්	වෛද්‍ය තිසර පෙරේරා 2018/11/17-2019/07/21
2018-2019	ධම්මික තන්තිරිමලගේ	ෂමීන් ජයතුංග 2019/02/17-2019/07/21	චලින්ද ඉලංකෝන්	වෛද්‍ය තිසර පෙරේරා
2019-2020	චන්දන ගුරුගේ	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	සුජීව රත්නායක
2020-2021	චන්දන ගුරුගේ	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	සුජීව රත්නායක
2021-2022	චන්දන ගුරුගේ	ෂමීන් ජයතුංග	අජිත් ෆර්ඩිනන්ඩස්	සුජීව රත්නායක
2022-2023	ලක්ෂ්මන් වේඩරුව	තිසර පෙරේරා	සරත් රත්නායක	අසංක වික්‍රමරත්න
2023-2024	ලක්ෂ්මන් වේඩරුව	ජයන්ත අභයරත්න	සරත් රත්නායක	අසංක වික්‍රමරත්න
2024-2025	සමන් ජයසිංහ	ඩුලිප් වීරතුංග	සරත් රත්නායක	අසංක වික්‍රමරත්න
2025-2026	ධම්මික තන්තිරිමලගේ	තිසර පෙරේරා	සරත් රත්නායක	සුරේෂ ආනන්ද


මලියදේව විද්‍යාලයේ ආදි කතෘන්



පූජ්‍ය
නැකැත්තේ ආනන්ද හිමි



සර් හෙන්රි
බල්කට්තුමා



අනගාරික
ධර්මපාල තුමා



හුළුගල්ල අධිකාරම් තුමා



ඩී.ජී.සී. ආටිගල මැතිතුමා



ඒ.එම්.
අබේගුණවර්ධන මැතිතුමා



සර් ජෝන් කොතලාවල
මැතිතුමා



දොස්තර
එව්.කේ.ටී. ද සිල්වා මැතිතුමා



යූ.බී. වන්නිනායක මැතිතුමා



ජී.ඊ. මඩවල මැතිතුමා



ටී.බී. මඩවල මැතිතුමා

ආදි ශිෂ්‍ය සංගමයේ පුරෝගාමීන්



පූජ්‍ය
නැකැත්තේ ආනන්ද හිමි



යූ.බී. වන්නිනායක
මැතිතුමා




ඊ.ඒ. පේරුසිංහ
මහතා



ඩී.බී. දිසානායක
මහතා



එම්.බී. පෙතියාගොඩ
මහතා



ඩී.ඒ. ජයතිලක
මහතා



ඊ.එස්. බාලසූරිය
මහතා



නීතීඥ
ජේ. ලංකාතිලක මහතා



කේ.පී. නිහාල් නන්ද
මහතා



ජනාධිපති නීතීඥ
චන්ද්‍රා ජයසේකර මහතා



නීතීඥ
එස්.බී. මඩවල මහතා



නීතීඥ
මංගල රණරාජා මහතා



මේජර් ජෙනරාල්
සුනිල් හෙන්නකෝන් මහතා



වෛද්‍ය
කමල් ජයසිංහ මහතා



ගාමිණී ස්වර්ණපාල
මහතා



කර්නල් පී.සී.
රත්නමලල මහතා



චන්දන ජයන්තක
ගුරුගේ මහතා



ලක්ෂ්මන් වේඬරුව
මහතා





ඉංජිනේරු ධම්මික
තන්තිරිමලගේ මහතා




සමන් ජයසිංහ
මහතා


ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු ගරු ලේකම්වරු


එම්.ඩබ්. ගුණසේකර මහතා


ඩී.බී. ඉලංකෝන් මහතා


ඩබ්.එම්. නන්දිසේන මහතා


මයුර බලල්ල මහතා


ටී.බී. ජයසේකර මහතා


හර්මන් පෙරේරා මහතා


එච්.ඒ. ධර්මසේන මහතා


සනත් පතිරණ මහතා


ඩී.ආර්. දිසානායක මහතා



කමල් හේරත් මහතා


එස්.බී. අරඹේපොල මහතා


දයා ගුණවර්ධන මහතා


සී.පී. රත්නායක මහතා


රංජිත් බක්මීවැව මහතා


ජේ.බී. ඇහැලේපොල මහතා


කේ.එම්.ටී. කෝණාර මහතා


හිල්ඩන් හමංගොඩ මහතා


පී.එස්. මංචනායක මහතා


ශාන්ති සිල්වා මහතා


ඕ.එස්. පෙරේරා මහතා


එන්.එස්.කේ.
විජේනායක මහතා


එච්.එම්.යූ.එන්.
ගුණතිලක මහතා



ගාමිණී ස්වර්ණපාල මහතා


ඩී.ඩබ්.කේ.යූ.ආර්.
ජයවර්ධන මහතා


එස්. කහදවආරච්චි මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ නිටපු ගරු ලේකම්වරු


ඩී.පී.සී. කුමාරසිංහ මහතා


රොහාන් ද සිල්වා මහතා


කර්නල්
පී.සී. රත්නමලල මහතා


ප්‍රසංග රත්නායක මහතා


සමන් ජයසිංහ මහතා


දමින්ද බණ්ඩාර මහතා


ඩබ්.එම්.ටී.බී.
විජේකෝන් මහතා


ෂමින් ජයතුංග මහතා


ඛුලිප් වීරතුංග
මහතා


අජිත් ෆර්ඩිනැන්ඩස්
මහතා


වෛද්‍ය තිසර පෙරේරා
මහතා


ජයන්ත අභයරත්න
මහතා


ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු ගරු භාණ්ඩාගාරිකවරු


ඊ.එස්. බාලසූරිය මහතා


එන්.ජේ. ද තාබෑ මහතා


විල්සන් ජයසිංහ මහතා


බී.එම්.ඒ. මුණමලේ මහතා


සී.බී. දිසානායක මහතා


ටී.එම්.එල්.
තෙන්නකෝන් මහතා


සේනක විජේකෝන්
මහතා


ගාමිණී ස්වර්ණපාල
මහතා


රෝහණ පුෂ්පලාල් මහතා


කිත්සිරි දොඩම්ගොඩ මහතා


ප්‍රියංකර ලියනගේ මහතා


සුජීව රත්නායක මහතා


ඛුලිප් වීරතුංග
මහතා


යුරාජ් සරත්චන්ද්‍ර
මහතා


නීතීඥ සාලුක සෙනරත්
මහතා


ජයන්ත අභයරත්න
මහතා


වෛද්‍ය තිසර පෙරේරා
මහතා


අසංක වික්‍රමරත්න
මහතා


සුරේෂ් ආනන්ද
මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ අනුශාසකවරු

ගරු සම්මානනීය අනුශාසකවරු


නිවටපු ගරු අග්‍රවිනිශ්චකාර
ජයන්ත ජයසූරිය
මැතිතුමා


සභාපති අල්ලස් හා දූෂණ
චෝදනා විමර්ශන කොමිෂන් සභාව
නීල් ඉද්දවෙල මහතා


ජනාධිපති
නීතිඥ චන්ද්‍රා
ජයසේකර මහතා


නිවටපු යුධ හමුදාපති
ජෙනරල් දයා රත්නායක
මහතා


මේජර් ජෙනරාල්
සුනිල් තෙන්නකෝන්
මහතා


නීතීඥ ජී.බී. සේනානායක
මහතා


මහින්ද මැදගොඩ
මහතා


ගාමිණී ස්වර්ණපාල
මහතා


කලමණාකරණ අධ්‍යක්ෂක
Esoft Metro Campus
වෛද්‍ය දුකාන් රාජපක්ෂ මහතා


කේ.එම්.කේ.කෝනාර
මහතා


රංජිත් ජයවර්ධන
මහතා


විශේෂඥ වෛද්‍ය ශමින්ත
අමරතුංග මහතා

ගරු අනුශාසකවරු


ලක්ෂ්මන් වේඩරුව
මහතා


චන්දන ගුරුගේ
මහතා


සමන් ජයසිංහ
මහතා


සරත් රත්නායක
මහතා


එන්.එස්.කේ. විජේනායක
මහතා


රෝහණ පුෂ්පලාල්
මහතා


සමන් නානායක්කාර
මහතා


බ්‍රිගේඩියර්
මංජුල ගුණසිංහ මහතා


අජිත් කරුණාරත්න
මහතා

නිලධාරී මණ්ඩලය 2025 - 2026

ගරු සභාපති



විදුහල්පති
ඩබ්.එම්.සී.කේ. මහමිතව
මහතා

ගරු ක්‍රියාකාරී සභාපති



ඉංජිනේරු ධම්මික
තන්තිරිමලගේ මහතා

ගරු ජ්‍යේෂ්ඨ උප සභාපති



යුරාප් සරත්චන්ද්‍ර
මහතා

ගරු සම ලේකම්



වෛද්‍ය තිසර පෙරේරා
මහතා

ගරු සම ලේකම්



සරත් රත්නායක
මහතා

ගරු භාණ්ඩාගාරික



සුරේෂ් ආනන්ද
මහතා

ගරු උප සභාපතිවරු

සුභ සාධක



දුලංජන අතපත්තු
මහතා

ක්‍රීඩා



ඉන්දික පෙරේරා
මහතා

වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනික මාර්ගෝපදේශක



රනේෂ් කුරේ
මහතා

යටිතල පහසුකම් සංවර්ධන සහ නඩත්තු



දිලුමි මුණසිංහ
මහතා

මුදල්



එරංග යාපා
මහතා

සාමාජීය



තිළිණ දිසානායක
මහතා

සාමාජික



සෙහාන් රාජසේකර
මහතා

අධ්‍යාපන



මධුර අමරතුංග
මහතා

ගරු උප ලේකම්



ඉංජිනේරු සුගත්
සේනානායක මහතා

ගරු උප භාණ්ඩාගාරික



මහේෂ් අධිකාරී
මහතා

ගරු මාධ්‍ය සම්බන්ධීකාරක



විජිත සේනාරත්න
මහතා

ගරු තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක



නුවන් පතිරණ
මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය 2025 - 2026

ගරු අභ්‍යන්තර විගණක



රවී ධර්මසේකර
මහතා

ගරු විගණක කමිටුව



විමල් ප්‍රේමදාස
මහතා



එස්.බී. හේවාවිතාරණ
මහතා



කීර්ති පතිරත්න
මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය 2025 - 2026



නෙරංජන් කුලරත්න
මහතා



නන්දක පොතුවැව
මහතා



ශමීන් ජයතුංග
මහතා



එල්.අයි.රත්නායක
මහතා



තාරක චන්ද්‍රසේකර
මහතා



නදීෂ් විජේකෝන්
මහතා



සුජීව රත්නායක
මහතා



මිතිල යටවර
මහතා



කේ.සී.බණ්ඩාර
මහතා



රජින්ත යටවර
මහතා



වතුමාල් චන්ද්‍රසිරි
මහතා



කේ.ඒ.ජේ.පී.එස්.ඒ.බණ්ඩාර
මහතා



හර්ෂ හියරාපිටිය
මහතා



බුද්ධික සමරකෝන්
මහතා



ජානක පතිරාජ
මහතා



කීර්ති සමරසිංහ
මහතා



රසික ගුණතිලක
මහතා



අනුරුද්ධ හේරත්
මහතා




දුමිදු තිලකරත්න
මහතා



ඉංජිනේරු පාලිත රත්නායක
මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය 2025 - 2026


ඉංදික ඉලංගකෝන්
මහතා


ඉංජිනේරු
ඊ.එම්.එස්.බී.ඒකනායක මහතා


අසංක ගුණසිංහ
මහතා


බුද්ධික ඇල්ලෙපොල
මහතා


ජයන්ත අභයරත්න
මහතා


ගාමිනී නෙත්තිකුමාර
මහතා


කිත්සිරි අමරසිංහ
මහතා


ප්‍රසංග රත්නායක
මහතා


හේමන්ත ප්‍රේමතිලක
මහතා



අජිත් ෆර්ඩිනැන්ඩස්
මහතා


ඛුලිප් වීරතුංග
මහතා


අසංක වික්‍රමරත්න
මහතා


මංජුල මදුරප්පෙරුම
මහතා


ඩී.බී.හේරත්
මහතා


ඉංජිනේරු තිලක් ගුණවර්ධන
මහතා


නදීර චන්දසේකර
මහතා


එච්.කේ.ඩී.යූ.අයි.අබේසිරි
මහතා


එච්.ඩබ්.අජන්ත ලක්මාල්
මහතා


ඩී.එම්.චන්දන නුවන් කුමාර
මහතා


ඊ.යූ.ඩී.බී.එච්.බී.ඇහැලේපොල
මහතා


පී.බී.ඩබ්.එම්.සී.ඇහැලගොල්ල
මහතා


එම්.එම්.ඒ.ඩී.බී.ගලගෙදර
මහතා


එච්.එච්.එම්.එස්.බී.හේරත්
මහතා


එම්.කේ.අයි.පෙරේරා
මහතා


පී.බී.එම්.ඩී.එල්.මොරගොල්ල
මහතා

ආදි ශිෂ්‍ය සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය 2025 - 2026


එම්.එල්.ජේ.මුතුගල
මහතා


කේ.එම්.ප්‍රියන්ත.කුමාර
මහතා


එස්.ඒ.ටී.ඩී.සමරකෝන්
මහතා


එස්.ඩී.එන්.සම්පත් කරුණාතිලක
මහතා



දුලීෂ කසුන් සරත් කුමාර
මහතා


බී.එම්.යූ.අයි.බී.බාලසූරිය
මහතා


වෛද්‍ය ආර්.ඒ.ඒ.එම්.
වික්‍රමරත්න මහතා


ඩබ්.එම්.කේ.එස්.මධුරගොඩ
මහතා


රනිල් අල්ගම
මහතා


එච්.කේ.ජේ.ප්‍රේමතිලක
මහතා


සම්පත් කෝරලගම
මහතා


ආනන්ද පතිරණ
මහතා


නන්දන අමරසිංහ
මහතා


කේ.ඒ.යූ.කේ.තිසේරා
මහතා


ඩී.සී.පී.කුමාරසිංහ
මහතා


කැළුම් මිදෙණිය
මහතා


ඒ.එම්.සී.පී.අධිකාරී
මහතා


කේ.ඒ.වී.බී.අබේසිංහ
මහතා


ඒ.ඩී.පී.අයි.වික්‍රමසිංහ
මහතා


මාධව කඩුපිටිආරච්චි
මහතා


ටී.එම්.ඒ.යූ.තෙන්නකෝන්
මහතා


බී.එම්.එල්.ටී.බස්නායක
මහතා



කපිල කුලසේකර
මහතා


පී.එච්.ටී.එස්.චන්ද්‍රසිරි
මහතා


චමින්ද රත්නපාල
මහතා

ආදී ශිෂ්‍ය සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය 2025 - 2026


නීතීඥ සම්පිදි ජයසේකර
මහතා


ඒ.එම්.ඩී.ඩී.අභයරත්න
මහතා


නුවන් බුළුමුල්ල
මහතා


කිත්සිරි සියඹලන්ගමුව
මහතා


සංඛ සමරවීර
මහතා


එල්.එච්.එම්.ඩී.යූ.ලන්සකාර
මහතා



මිහිරාන් හේරත්
මහතා


බන්දුල බස්නායක
මහතා


නීතීඥ යසස් ගුණවර්ධන
මහතා


කල්ප ගලප්පත්ති
මහතා


කසුන් නිලන්ක රාජපක්ෂ
මහතා



චාමර රාජසූරිය
මහතා


ප්‍රවීන් පුෂ්පකුමාර
මහතා


මහේන්ද්‍ර මාපා රත්මලේ
මහතා


නුවන් නුවර වැව
මහතා


සංජය දළුවත්ත
මහතා


ලක්මාල් ගුණසේකර
මහතා


කේ.කේ.එන්. ද සිල්වා
මහතා


සාලිය කරුණාරත්න
මහතා

මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ වාර්ෂික වාර්තාව 2025 - 2026

මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය සංවත්සරික මහා සභාව 2025 සැප්තැම්බර් 21වැනි දින ක්‍රියාකාරී සභාපති සමන් ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් නැකැත්තේ ආනන්ද අනුස්මරණ ආදි ශිෂ්‍ය සංගම් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.එහිදී 2025/26 වර්ෂය සඳහා පහත නිලධාරීන් පත්විය.

01	ගරු සභාපති	විදුහලේ විදුහල්පතිතුමා
02	ගරු ක්‍රියාකාරී සභාපති	ඉංජිනේරු ධම්මික තන්තිරිමුල්ලගේ මහතා
03	ගරු සමලේකම්	වෛද්‍ය තිසර පෙරේරා මහතා
04	ගරු සමලේකම්	සරත් රත්නායක මහතා
05	ගරු භාණ්ඩාගාරික	සුරේෂ් ආනන්ද මහතා
06	ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති	යුරාජ් සරත්චන්ද්‍ර මහතා
07	ගරු උප සභාපති - ක්‍රීඩා	ඉන්දික පෙරේරා මහතා
08	ගරු උප සභාපති - සුභ සාධක	දුලංජන අතපත්තු මහතා
09	ගරු උප සභාපති වෘත්තිය සහ තෘතියික අධ්‍යාපනික මාර්ගෝපදේශක	රනේෂ් කුරේ මහතා
10	ගරු උප සභාපති - යටිතල පහසුකම් සංවර්ධන සහ නඩත්තු	දිලුම් මුණසිංහ මහතා
11	ගරු උප සභාපති - මුදල්	එරංග යාපා මහතා
12	ගරු උප සභාපති - සාමාජීය	නිලිණ දිසානායක මහතා
13	ගරු උප සභාපති - සාමාජික	සෙෂාන් රාජසේකර මහතා
14	ගරු උප සභාපති - අධ්‍යාපන	මදුර අමරතුංග මහතා
15	ගරු උප ලේකම්	සුගත් සේනානායක මහතා
16	ගරු උප භාණ්ඩාගාරික	මහේෂ් අධිකාරි මහතා
17	ගරු තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක	නුවන් පතිරණ මහතා
18	ගරු මාධ්‍ය සම්බන්ධීකාරක	විජිත සේනාරත්න මහතා

- මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවට අනුව අභ්‍යන්තර විගණන කමිටුව ලෙස පහත නම් සඳහන් නිළධාරීන් 2025/2026 වසර සඳහා තෝරා පත්කරගන්නා ලදි.

01	ගරු අභ්‍යන්තර විගණක	රවී ධර්මසේකර මහතා
02	විගණක කමිටුව	විමල් ප්‍රේමදාස මහතා
03	විගණක කමිටුව	එස්.ඩී. හේවාවිතාරන මහතා
04	විගණක කමිටුව	කීර්ති පතිරත්න මහතා

➢ මලියදේව විද්‍යාලයිය ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවට අනුව අනුකාරක සභාවල පසුගිය ක්‍රියාකාරින් ලෙස පහත සඳහන් ආදි ශිෂ්‍ය සාමාජිකයන් තෝරා පත්කර ගන්නා ලදි.

1	**නෙරංජන් කුලරත්න මහතා**	**11**	**චතුමාල් චන්ද්‍රසිරි මහතා**
2	**නන්දක පොතුවැව මහතා**	**12**	**කේ.ඒ.ජේ.පී.එස්.ඒ. බණ්ඩාර මහතා**
3	**ශමීන් ජයතුංග මහතා**	**13**	**හර්ෂ හියරාපිටිය මහතා**
4	**එල්.අයි. රත්නායක මහතා**	**14**	**බුද්ධික සමරකෝන් මහතා**
5	**තාරක චන්ද්‍රසේකර මහතා**	**15**	**ජානක පතිරාජ මහතා**
6	**නදීෂ් විජේකෝන් මහතා**	**16**	**කීර්ති සමරසිංහ මහතා**
7	**සුජීව රත්නායක මහතා**	**17**	**රසික ගුණතිලක මහතා**
8	**මිතිල යටවර මහතා**	**18**	**අනුරුද්ධ හේරත් මහතා**
9	**කේ.සී. බණ්ඩාර මහතා**	**19**	**දුමිදු තිලකරත්න මහතා**
10	**රජින්ත යටවර මහතා**		

➢ මලියදේව විද්‍යාලයිය ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවට අනුව විධායක මණ්ඩලයේ අභිමතය පරිදි පහත සඳහන් සම්පත් දායකයන් ලෙස ආදි ශිෂ්‍ය සාමාජිකයන් 05 දෙනෙකු තෝරා පත් කරගන්නා ලදි.

01	**ඉංදික ඉලංගකෝන් මහතා - ප්‍රධාන ලේකම් වයඹ පළාත් සභාව**
02	**ඉංජිනේරු පාලිත රත්නායක මහතා - ප්‍රධාන විදුලි ඉංජිනේරු කුරුණෑගල**
03	**ඉංජිනේරු ඊ.එම්. එස්.බී. ඒකනායක මහතා - ප්‍රධාන ඉංජිනේරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
04	**අසංක ගුණසිංහ මහතා**
05	**බුද්ධික ඇල්ලෙපොල මහතා**

➢ මලියදේව විද්‍යාලයිය ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවට අනුව 45 ට වැඩි සමාජිකයන් 07 දෙනෙකු පහත සඳහන් ලෙස තෝරා පත් කරගන්නා ලදි.

01	**අජිත් ෆර්ඩිනැන්ඩස් මහතා**	**05**	**ඩී.බී. හේරත් මහතා**
02	**ඩුලිප් වීරතුංග මහතා**	**06**	**ඉංජිනේරු තිලක් ගුණවර්ධන මහතා**
03	**අසංක වික්‍රමරත්න මහතා**	**07**	**නදීර චන්ද්‍රසේකර මහතා**
04	**මංජුල මදුරප්පෙරුම මහතා**		

➢ මලියදේව විද්‍යාලයිය ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවට අනුව 55 ට වැඩි සමාජිකයන් 05 දෙනෙකු පහත සඳහන් ලෙස තෝරා පත් කරගන්නා ලදි.

01	**ජයන්ත අභයරත්න මහතා**	**04**	**ප්‍රසංග රත්නායක මහතා**
02	**ගාමිනී නෙත්තිකුමාර මහතා**	**05**	**හේමන්ත ප්‍රේමතිලක මහතා**
03	**කිත්සිරි අමරසිංහ මහතා**		

- 2025/2026 අනු කාරක සභාවල ලේකම්වරු ලෙස පහත සඳහන් ආදි ශිෂ්‍යයන් තෝරා පත්කර ගන්නා ලදි.

01	**ගරු ලේකම් ක්‍රීඩා**	**තාරක චන්ද්‍රසේකර මහතා**
02	**ගරු ලේකම් මුදල්**	**රජීන්ත යටවර මහතා**
03	**ගරු ලේකම් අධ්‍යාපන**	**වෛද්‍ය මාධව වික්‍රමරත්න මහතා**
04	**ගරු ලේකම් සාමාජයිය**	**නෙරංජන් කුලරත්න මහතා**
05	**ගරු ලේකම් සාමාජික**	**ලහිරු මුතුගල මහතා**
06	**ගරු ලේකම් සුභ සාධක**	**අජන්ත ලක්මාල් මහතා**
07	**ගරු ලේකම් වෘත්තිය හා තෘතියික අධ්‍යාපනික**	**චතුමාල් චන්ද්‍රසිරි මහතා**
08	**ගරු ලේකම් යටිතල පහසුකම් සංවර්ධන සහ නඩත්තු**	**අනුරුද්ධ හේරත් මහතා**

- ඉහත සාමාජිකයන් හැරුණුකොට ව්‍යවස්ථාවට අනුව ජන්දයෙන් තේරිපත් වූ කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයන් 20ක්ද,අනුකණ්ඩායම්,අනු නියෝජිතයන් සමග මුළු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් 150ක ගෙන් පමණ ප්‍රමාණයකින් සමන්විත විය.ව්‍යවස්ථාවට අනුව දෙවන කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේ දී ගරු උප සභාපතිවරුන් හට තම අනුකාරක සභා සඳහා අවශ්‍ය කාරක සභිකයින් තෝරා පත්කර දෙනු ලැබිණි.මෙම පිරිසට අමතරව අනු කමිටු වල ක්‍රියාකාරිත්වය සඳහා ආදි සිසුන් ද මෙම වසරේ පැවති විවිධ ව්‍යාපෘති වලට සහභාගි විය.

වෛද්‍ය තිසර පෙරේරා/සරත් රත්නායක
ගරු සමලේකම්වරු

මලියදේව විද්‍යාලයීය ගරු විදුහල්පතිතුමාගේ වාර්තාව



අභිමානවත් වූත්, ප්‍රෞඩ වූත් මලියදේව විද්‍යාලයේ ගමන් මගෙහි අතීත ජයග්‍රහණීය මතකයන්, වර්තමාන ජයග්‍රහණ උදෙසා ඉටුකරන මෙහෙයන් හා අනාගත ජයග්‍රාහී අපේක්ෂාවන් සඵල කරවීම උදෙසා සක්‍රීය දායකත්වයක් සපයන ආදී ශිෂ්‍ය සංගමයට විද්‍යාලයේ වර්තමාන විදුහල්පතිවරයා ලෙස මාගේ ගෞරවාදරය මෙසේ ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

මලියදේව විද්‍යාලයේ වර්තමාන අවශ්‍යතා හඳුනාගනිමින් ඒවා සපුරාලීම සඳහා සම්පත්, දැනුම, අත්දැකීම් හා මානව ශක්තීන් එක් රැස් කිරීම තුළින් ආදී ශිෂ්‍ය සංගමය ඉටුකරන මෙහෙවර පාසලේ අභිවෘද්ධියට පමණක් සීමා නොවී අනාගත මලියදේව පරපුරේ හැකියාවන්, කුසලතාවන් හා අපේක්ෂාවන් පෝෂණය කරන සමාජමය ආයෝජනයක් බව සඳහන් කරනුයේ මහත් ගෞරවයෙනි.

මලියදේව මාතාවගේ අතීත උරුමය සුරකිමින් වර්තමානය සුපෝෂණය කර අනාගතයද ස්ථිර කරන්නා වූ උදාර මෙහෙවර වෙනුවෙන් ආදී ශිෂ්‍ය සංගමයේ ගරු සභාපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලය මලියදේව විද්‍යාලයේ සුභසිද්ධිය සඳහා මනා ශික්ෂණයකින් හා අනෝන්‍යය විශ්වාසයකින් කටයුතු කරනුයේ නිරන්තරව විද්‍යාලයේ ඉදිරි අභිවෘද්ධියේ මූලික කොටස් කරුවන් බව මනාව පිළිඹිඹු කරමිනි. මෙම ක්‍රියාදාමය විද්‍යාලයට මහත් ආශිර්වාදයක් මෙන්ම අප්‍රතිහත කීර්තියකි.

පසුගිය වර්ෂය පුරාවට මෙම කටයුතු සාර්ථක කරලීමෙහිලා විද්‍යාලය සමග ඉතා සහයෝගයෙන් කටයුතු කළ ගරු ක්‍රියාකාරී සභාපති ඉංජිනේරු ධම්මික තන්තිරිමලගේ මහත්මා ඇතුළු සමස්ත ආදී ශිෂ්‍ය සංගමයේ නිලධාරී මඩුල්ලටත්, සාමාජික මහත්වරුන්ටත් ස්තූතිවන්ත වන අතර මලියදේව විදු බිමෙන් එදා ලැබූ නිපුණත්වයෙන් ලද ආලෝකය නැවත උගත් පාසලටම දායාද කරමින් පරපුරෙන් පරපුරට අභිමානයේ පහන් සිළුව රැගෙන යන මලියදේව ආදී ශිෂ්‍ය සංගමයේ මෙහෙවර සදා සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

W.M.C.K. **මහමිතව**
විදුහල්පති

ගරු සභාපතිතුමාගේ වාර්තාව



මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ 2025/2026 වසර සඳහා සභාපතිවරයා වශයෙන්, පසුගිය වසර තුළ අප සංගමය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ අත්කරගත් ප්‍රගතිය පිළිබඳව මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා හට මහත් ගෞරවයකි.

අපගේ මූලික අරමුණ වූයේ මලියදේව විද්‍යාලයේ අධ්‍යාපනික, ක්‍රීඩා, සමාජීය හා යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීමත්, ආදි ශිෂ්‍ය සංගමයේ කාර්යක්ෂමතාව සහ සාමාජික සහභාගීත්වය තවදුරටත් ශක්තිමත් කිරීමත් ය.

එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විධායක මණ්ඩලය, නිලධාරී මණ්ඩලය, අනුකමිටු, අණු කණ්ඩායම්, විද්‍යාලයීය විදුහල්පතිතුමා, ආචාර්ය මණ්ඩලය සහ සියලුම ආදි ශිෂ්‍ය සහෝදරයන් ලබාදුන් සහයෝගය අතිශයින් අගය කරමි.

වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා ජයග්‍රහණ

1. වාර්ෂික වැඩ සැලැස්ම

වසර ආරම්භයේදීම සංගමයේ ඉදිරි ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික වැඩ සැලැස්ම (Year Planner) සකස් කර, එය පළමු විධායක කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලදී.

මෙම වැඩ සැලැස්ම මගින් වසර පුරා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් සඳහා පැහැදිලි මාර්ග සටහනක් සකස් කර ගැනීමට හැකි විය. තවද වසර පුරා වැඩ සැලසුම් කිරීමට පහසු වීම , ඉලක්ක පැහැදිලිව හඳුනාගෙන ඒවා සාර්ථක කරගැනීමට උපකාරී වීම, කාලය නිසි ලෙස කළමනාකරණය කරගත හැකි වීම, වැදගත් කාර්යයන්, රැස්වීම් සහ සිදුවීම් අමතක නොවීමට උපකාරී විය.

2. මලිදෙව් සහන යාත්‍රා

මෙම වසරේ ආදී ශිෂ්‍ය සංගමයට මුහුණ දීමට සිදුවූ ප්‍රථම අභියෝගය වූයේ "දිත්වා" ස්වභාවික ව්‍යසනයි. මෙම ව්‍යසනයට මුහුණ දුන් වයඹ පළාතේ ජනතාව වෙනුවෙන් දින තුනක් තුල රුපියල් ලක්ෂ පහහකට ආසන්න වටිනාකමකින් යුත් වියලි ආහාර ද්‍රව්‍ය එක්රැස් කර බෙදාහරින ලදී.

3. වාර්ෂික ක්‍රිකට් තරගය

මෙවර වාර්ෂික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීමේ සත්කාරකත්වය මලියදේව ආදි ශිෂ්‍ය සංගමය වෙත හිමිවිය. මෙහිදී දෙදින ක්‍රිකට් තරගය ප්‍රථම වතාවට තෙදින ක්‍රිකට් තරගයක් ලෙස පැවැත්වීම සහ සීමිත ඕවර් තරගය ඊළඟ සති අන්තයේ පැවැත්වීමට සිදුවීම නවමු අත්දැකීමක් මෙන්ම විශාල අභියෝගයක්ද විය. සති අන්ත දෙකක තරග දෙකක් පැවැත්වීම සංවිධානය කිරීම සහ ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම තරග සංවිධායකයින්ට මුහුණදීමට සිදුවූ විශාල අභියෝගයක් විය. නමුත් වාර්ෂික ක්‍රිකට් තරග සංවිධායක කමිටුවේ සභාපති ලෙස කටයුතු කල මලියදේව ආදි ශිෂ්‍ය සංගමයේ ගරු ලේකම් වෛද්‍ය තිසර පෙරේරා ඇතුලු තරග සංවිධායක කමිටුව එම අභියෝග සියල්ලටම විශිෂ්ට අයුරින් මුහුණදී ඉතිහාසයේ වැඩිම ආදායමක් ඉපයූ වාර්ෂික ක්‍රිකට් තරගාවලිය ලෙස වාර්ෂික ක්‍රිකට් තරගාවලිය අවසන් කිරීමට හැකිවිය.

වෛද්‍ය තිසර පෙරේරා ඇතුලු තරග සංවිධායක කමිටුවට මාගේ විශේෂ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

4. මලිදෙව් ශිෂ්‍යභට කණ්ඩය Herman Loos ශූරතාවය ජයග්‍රහණය කිරීම.

2025 වර්ෂයේදී රන්ටැබේ ජාතික ශිෂ්‍යභට කදවුරේ පැවති සමස්ත ලංකා ශිෂ්‍යභට තරගාවලියේදී, මලිදෙව් ශිෂ්‍යභට කණ්ඩය විසින් දිවයිනේ සියලුම ශිෂ්‍යභට කන්ඩයන් අභිබවා Herman Loos ශූරතාවය ජයග්‍රහණය කිරීමට සමත්විය. වසර 13කට පසු ලැබූ මෙම ජයග්‍රහණය විද්‍යාලයේ කීර්තිනාමය වැඩිකිරීමට විශාල

පිටුවහලකි. එබැවින් එම ජයග්‍රාහී මලිදෙව් ශිෂ්‍යභට කණ්ඩය උදෙසා උපහාර උළෙලක් ආදිශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කර Epitome හෝටලයේදී, විද්‍යාලයේ ගරු විදුහල්පති තුමාගේද සහභාගිත්වයෙන් පවත්වන ලදී.

5. ආදි ශිෂ්‍ය සංගමය කාර්යාලයේ කටයුතු ක්‍රමවත් කිරීම

ආදි ශිෂ්‍ය සංගමය කාර්යාලයේ දෛනික පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂම හා ක්‍රමවත් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මෙමගින් සාමාජික සේවාවන් සහ සංගමයේ පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට හැකි වී තිබේ.

6. සාමාජික කාඩ්පත් නිකුත් කිරීම ක්‍රමවත් කිරීම

පසුගිය කාලය පුරාවට නව සාමාජිකයින් හට නිකුත් කිරීමට නොහැකිව තිබූ සියලුම සාමාජික කාඩ්පත් මුද්‍රණය කර සාමාජිකයන් වෙත ලබාදීමට කටයුතු කරන ඇත.

එමෙන්ම, ඉදිරියේදී නව සාමාජිකත්වය ඉල්ලුම් කරන සාමාජිකයින් හට, සාමාජිකත්වය සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසු දින කිහිපයක් ඇතුළත නව සාමාජික කාඩ්පත් මුද්‍රණය කර නිකුත් කළ හැකි වන පරිදි ක්‍රමවේදය කාර්යක්ෂම කර ඇත.

7. නව ගිණුම්කරණ හා POS මෘදුකාංග පද්ධතිය

ආදි ශිෂ්‍ය සංගමයේ මූල්‍ය කටයුතු වඩාත් නිවැරදිව හා විනිවිදභාවයෙන් පවත්වාගෙන යාම සඳහා ගිණුම්කරණ සහ POS මෘදුකාංග පද්ධතියක් වන "Quick Book" මෘදුකාංගය මිලදී ගෙන ස්ථාපනය කරන ලදී. විශේෂයෙන්ම Quick Book මෘදුකාංගය හඳුන්වාදීම තුළින්, ඉදිරි විධායක කමිටුවට ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ සියලුම ගනුදෙනු නිවැරදිව යාවත්කාලීන කිරීම වඩාත් පහසු වනු ඇත.

මෙය ආදි ශිෂ්‍ය සංගමය හි මූල්‍ය කළමනාකරණය තවදුරටත් වෘත්තීයමය හා විධිමත් මට්ටමකට ගෙන යාම සඳහා ගත් වැදගත් පියවරකි.

8. නව ආදී ශිෂ්‍ය සංගම් භාණ්ඩ අලෙවිහල ස්ථාපිත කිරීම සහ Barcode පද්ධතිය හඳුන්වාදීම

ආදී ශිෂ්‍ය සංගම් කාර්යාලය තුල ස්ථාපිත කර තිබූ ආදී ශිෂ්‍ය සංගම් භාණ්ඩ අලෙවිහල මඩවල ශාලාවේ පිහිටි පැරණි ආදී ශිෂ්‍ය සංගම් කාර්යාල කාමරයේ ස්ථාපිත කර, එහි භාණ්ඩ අලෙවි කටයුතු වඩාත් නිවැරදිව කළමනාකරණය කිරීම සඳහා Barcode System එකක් හඳුන්වා දෙන ලදී.

මෙම නව ක්‍රමවේදය මගින් POS ගනුදෙනු, භාණ්ඩ තොගය සහ අලෙවි කටයුතු වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව පාලනය කිරීමට හැකි වේ.

9. අනුකාරකසභා මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

ආදී ශිෂ්‍ය සංගමය මගින් වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලද පහත ව්‍යාපෘති අනුකාරකසභා මගින් ක්‍රියාත්මක කරන ලද අතර, එම ව්‍යාපෘතිවල විස්තර අදාල අනුකාරකසභා වාර්තා සමග ඉදිරිපත් කෙරේ.

- ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා Spoken English වැඩසටහන
- ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා Good Habits - Bad Habits වැඩසටහන
- ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා Good Touch - Bad Touch වැඩසටහන
- 5 වන ශ්‍රේණියේ සියලුම දරුවන් සඳහා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන
- 5 වන ශ්‍රේණියේ දරුවන්ගේ දෙමව්පියන් සඳහා, තම දරුවන් මත්ද්‍රව්‍ය උවදුරෙන් ගලවා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.
- 10 /11 ශ්‍රේණිවල සිසුන් සඳහා Positive Attitiude Development වැඩසටහන.

ගරු සභාපතිතුමාගේ වාර්තාව

- විද්‍යාලයේ 1 ශ්‍රේණියට ඇතුලත්වන දරුවන් සඳහා "මලිදෙව් සිරිත" පොත මුද්‍රණය කර දරුවන්ට බෙදාදීම.
- Next Gen Devans - විද්‍යාලයීය සිසුන් සඳහා මාර්ගෝපදේශ වැඩසටහන
- තාක්ෂණික අංශයේ සිසුන් සඳහා ප්‍රයෝගික දැනුම ලබාදීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සම්හන්ධීකරණය කරදීම.
- ගුරු මණ්ඩලය සඳහා අභිප්‍රේරණ වැඩසටහන
- 6 සහ 7 ශ්‍රේණි සඳහා නව විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම
- අන්තර් අණුකණ්ඩායම් සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය
- Quadrafest සංගීත වැඩසටහන
- Devans Night
- Annual Dinner
- කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින්ගේ වාර්ෂික චාරිකාව.

මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සියලුම අණුකාරකසභා වල සභාපතිවරුන්, ලේකම්වරුන්, අණුකාරක සභා සාමාජිකයින්, සියලුම අනුග්‍රාහකයන් සහ සහයෝගය ලබාදුන් සියලුම දෙනාට මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.

ස්තූතිය

- මෙම වසර තුළ අප අත්කරගත් ප්‍රගතිය කිසිසේත්ම එක් පුද්ගලයෙකුගේ හෝ එක් කමිටුවක උත්සාහයක ප්‍රතිඵලයක් නොවේ. එය මලියදේව නාමය වෙනුවෙන් එකමුතුව ක්‍රියා කළ සියලුම ආදි ශිෂ්‍යයන්ගේ සාමූහික කැපවීමේ ප්‍රතිඵලයකි.
- ඒ අනුව, මෙම වසර පුරා මා සමඟ ඉතාම සමීපව කටයුතු කළ ආදි ශිෂ්‍ය සංගමයේ ගරු ලේකම් වෛද්‍ය තිසර පෙරේරා, ගරු භාණ්ඩාගාරික සුරේෂ් ආනන්ද, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති යුරාජ් සරත්චන්ද්‍ර සොයුරන්ට මාගේ විශේෂ ප්‍රණාමය පුදකරමි. එලෙසම එකම කණ්ඩායමක් ලෙස සාමුහිකව ගන්නා කුමන හෝ තීරණයක් උදෙසා පෙනීසිටිමින් එකම කණ්ඩායමක් ලෙස වසර පුරාවටම කටයුතු කල නිලධාරී මණ්ඩලයටත් මාගේ ප්‍රණාමය පුදකරමි. එලෙසම ආදි ශිෂ්‍ය සංගමයේ ගරුත්වය වෙනුවෙන් සැමදා පෙනීසිටි ගරු අනුශාසක වරුන්ටත් සියලුම කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින්ටත් මගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.
- විශේෂයෙන්ම මලියදේව විද්‍යාලයේ ගරු විදුහල්පති ඩබ්ලිව්. එම්. සී. කේ. මහමිතව මැතිතුමාටත් විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයටත්, ගුරු මණ්ඩලයටත්, අපගේ වැඩසටහන් සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමි.
- එමෙන්ම, ආදි ශිෂ්‍ය සංගමය හි වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා තම කාලය, ශ්‍රමය, දැනුම සහ සම්පත් නොමසුරුව ලබාදුන් සියලුම ආදි ශිෂ්‍ය සහෝදරයින් සියලු දෙනාටත්, අප සමඟ අත්වැල් බැඳගත් සියලුම අනුග්‍රාහකයන්ටත් මාගේ ගෞරවාන්විත ස්තූතිය පිරිනමමි.

ඉදිරි දැක්ම

- අප මෙතෙක් ලබාගත් ජයග්‍රහණ අපගේ අවසාන ඉලක්කය නොවේ. ඒවා ඉදිරි ගමන සඳහා ශක්තිමත් පදනමක් පමණි.
- අපගේ ඉදිරි අරමුණ විය යුත්තේ ආදි ශිෂ්‍ය සංගමය තවදුරටත් ශක්තිමත්, විනිවිදභාවයෙන් යුතු, නවීන හා කාර්යක්ෂම ආයතනයක් බවට පත් කරමින්, මලියදේව විද්‍යාලයේ වර්තමාන හා අනාගත පරපුරේ දරුවන් වෙනුවෙන් කළ හැකි උපරිම දායකත්වය ලබාදීමයි.
- අපගේ පාසලේ අධ්‍යාපනය, ක්‍රීඩාව, විනය, තාක්ෂණය, ශිෂ්‍ය සුබසාධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ දායකත්වය තවදුරටත් පුළුල් කිරීමට අප සියලු දෙනා එක්ව

ගරු සභාපතිතුමාගේ වාර්තාව

කටයුතු කළ යුතුය.

- අපගේ සියලු කටයුතුවල මූලික අරමුණ වන්නේ "මලියදේවය වෙනුවෙන් - මලියදේව දරුවන් වෙනුවෙන්" යන දැක්ම තුළින් අපගේ පාසල තව තවත් ඉදිරියට ගෙන යාමයි.
- අවසාන වශයෙන්, මෙම වසර තුළ අප සමඟ සිටි, අපට සහයෝගය දැක්වූ සහ අපගේ කාර්යයන් විශ්වාස කළ සියලුම මලියදේව ආදි ශිෂ්‍යයන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.
- එලෙසම 2026-2027 වසර සඳහා තේරී පත්වන නව සභාපතිතුමා ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩල සියලුම සාමාජිකයින්ට මගේ හදපිරි සුබපැතුම්ද මේ සමග එක්කරමි.

මලියදේවය අපගේ පාසල පමණක් නොව, අපගේ ජීවිතයේ අභිමානයයි.

එම අභිමානය තව තවත් ඉහළ නැංවීම සඳහා අප සියලු දෙනා එකමුතුව ඉදිරියට යමු.

මලියදේවයට ජය වේවා!

මලියදේව ආදි ශිෂ්‍ය සංගමයට ජය වේවා!

ඉංජිනේරු ධම්මික තන්තිරිමුල්ලගේ
ගරු ක්‍රියාකාරී සභාපති
මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපතිතුමාගේ වාර්තාව



2025/2026 වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ උප සභාපති ලෙස පත් වී එම වර්ෂය තුල ගරු ක්‍රියාකාරී සභාපතිතුමාගේ මඟපෙන්වීම යටතේ උපසභාපතිවරුන් සමඟ සිදුකරන ලද විවිධාකාර ව්‍යාපෘති පිළිබඳව ඉතාමත් තෘප්තිමත්ව මෙම පණිවිඩය නිකුත් කරමි.

ප්‍රථමයෙන් 2025 වර්ෂය අවසානයේ දී පැමිණි දිට්වා සුළිකුණාටුව නිසා අපගේ ව්‍යාපෘති කිහිපයක් කල්දැමීමට සිදුවීම ගැන කණගාටු වන අතර එම සුළි කුණාටුව නිසා අසරණ වුවන් ගැන මලියදේව ආදිශිෂ්‍ය සංගමය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරමි.

නමුත් අප ආදිශිෂ්‍ය සංගමය මගින් එම අසරණ වූවන් වෙනුවෙන් වියළි ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක් එම ගම්බිම් බලා රැගෙන ගොස් කුරුණෑගල ප්‍රධානම බෞද්ධ පාසලේ ආදි ශිෂ්‍ය සංගමය වශයෙන් අපගේ වගකීම නොපිරිහෙළා ඉටුකිරීම ගැන සතුටු වෙමි.

2026 වර්ෂයෙන් අනු කණ්ඩායම් අතර පැවැත්වෙන සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය සාමාජික අනු කමිටුව සමඟ එක්ව පෙබරවාරි මාසයේදී ඉතා සංවිධානාත්මකව පවත්වන ලදි. එම තරඟාවලියේ මූලික අරමුණ වූයේ අප ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය වර්ධනය කිරීම හා සුහදතාවය ඇති කිරීමයි. මෙම තරඟාවලිය සංවිධානය කිරීමට ප්‍රධාන කාර්යයක් ඉටුකල සාමාජික උප සභාපති සෙෂාන් රාජසේකර මහතාටත්, දිලුම් මුණසිංහ මහතාටත් අනුග්‍රාහකත්වය ලබා දුන් අනු කණ්ඩායම් වලටත් සුභ පතන්නන්ටත් ස්තූතිය පුද කරමි.

පසුගිය වර්ෂයේ බලාපොරොත්තු වූ පරිදිම මෙවර අනුකණ්ඩායම් විශාල ප්‍රමාණයක් අප ආදිශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය ලබාගත් අතර මෙවර ක්‍රීඩා කළ සියලු දෙනා මලියදේව ආදි ශිෂ්‍ය සංගමයේ සමාජිකයින් වීම කැපී පෙණුනි. එමෙන්ම මෙවර තරඟාවලිය අවු 40ට වැඩි හා 40 ට අඩු ලෙස කණ්ඩායම් 02 ක් යටතේ පැවත් වූ අතර කැපී පෙනෙන ත්‍යාග ප්‍රමාණයක් ලබාදීමට හැකිවිය.

එමෙන්ම කණ්ඩායම් වැඩිම ප්‍රමාණයක් සහභාගී වූ ශ්‍රී ලංකාවේ ආදි ශිෂ්‍ය සංගමයක් සංවිධානය කල සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය මෙය බව දැන ගැනීමට ලැබීමද එවැනි තරඟාවලියක් සංවිධානය කිරීමට හැකි වීමද මා හට ලැබූ විශාල භාග්‍යයකි.

අවු 60ට වැඩි හා ආදිශිෂ්‍ය සංගමයේ විධායක කමිටුව අතර පැවති තරඟයද කාගේත් සිත් ගත් අංගයක් විය.

මෙවර ආදි ශිෂ්‍ය පාපන්දු අනු කණ්ඩායම හා ආදිශිෂ්‍යභට අනු කණ්ඩායම ආදිශිෂ්‍ය සංගමය හා ලියාපදිංචි කරවීමට හැකි වූ අතර පාපන්දු ක්‍රීඩාව නගා සිටුවීම සඳහා අනු කණ්ඩායම් සමඟ සුහද පාපන්දු තරඟාවලියක් පවත්වන ලදි.

ආදිශිෂ්‍යභට අනුකණ්ඩායම ඉතා සංවිධානාත්මකව මෝටර් රැලියක් පැවැත් වූ අතර එයින් ලැබූ අනුග්‍රහයන් මඟින් මෙම වසරේත් ඉදිරි වසර වලත් පාසලේ ශිෂ්‍යභටයන් සඳහා පහසුකම් ලබාදීමට කටයුතු කරනු ඇතැයි සිතමි. මෙවැනි කණ්ඩායම් අප හා එකතුවීම මලියදේව ආදි ශිෂ්‍ය සංගමයේ ජයග්‍රහණයකි.

මෙවර පැවත් වූ මලියදේව ශාන්ත ආනා මහා ක්‍රිකට් තරඟාවලිය තුන් දින තරඟයක් ලෙස ප්‍රථම වරට සංවිධානය කල අතර එක් දින තරඟය ද ඉතා සාර්ථකව පවත්වන ලදී. ඒ සඳහා විශේෂ සංවිධාන ශක්තියක් දැරූ අප ලේකම් තුමාටත්, ක්‍රීඩා අනුකාරක සභාවටත් ස්තූතිවන්ත වන අතර ගරු ක්‍රියාකාරී සභාපතිතුමාගේ පූර්ණ ආශිර්වාදය සහිතව මෙතෙක් ලබාදුන් විශාලම අනුග්‍රාහක මුදල් සොයා දීමට මා හට හැකිවිය. එය මලියදේව ආදි ශිෂ්‍ය සංගමයට විශාල ශක්තියක් වූවා යැයි සිතමි.

මුදල්, ක්‍රීඩා හා විෂය බාහිර, සාමාජික, සාමාජීය, අධ්‍යාපන, වෘත්තීය හා තෘතියික අධ්‍යාපනික, යටිතල පහසුකම් දියුණු කිරීම යන අනුකාරක සභා වලින් කරනු ලැබූ ව්‍යාපෘති සඳහා මාගේ පූර්ණ සහයෝගය ලබාදීමට හැකි විය.

ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපතිතුමාගේ වාර්තාව

සෑම වසරකම ලබාදෙන හොඳම කණ්ඩායම ඇගයීමට ලක් කිරීම මෙම වසරේත් ලබා දීමට බලාපොරොත්තුවන අතර නැගී එන කණ්ඩායම ඇගයීමට ද බලාපොරොතුත්වෙන් සිටිමි.

විශේෂයෙන් ක්‍රියාකාරී සභාපතිතුමා වන ධම්මික තන්තිරිමලගේ මහතාට ස්තූතිවන්ත අතර ඔහු සංගමයේ නොමැති අවස්ථාවල ඔහුගේ වගකීම් මා හට දෙවරක් නොසිතා ලබාදුනි. එමෙන් නියම නායකයෙකු ලෙස මා ඇතුලු අප කණ්ඩායම ඉදිරියට රැගෙන ගිය අතර අපහට ඇති වූ අපහසු අවස්ථාවන් වල ඔහු පෙරට පැමිණ ඉදිරියෙන් සිටගැනීම සියලු දෙනාට ඉතා ශක්තියක් විය. ඔහුගේ සෘජු තීරණ ගැනීමේ හැකියාව ඇතුළු ඔහුගෙන් ඉගෙනගත් දේ ගැන සතුටු වෙමි.

2025 /2026 වර්ෂයේ සියලුම අනුශාසකවරුන්ටත්/ දොස්තර තිසර පෙරේරා ලේකම්තුමා/ සුරේෂ් ආනන්ද භාණ්ඩාගාරිකතුමා/ උපසභාපතිවරුන් වන රනේෂ්කුරේ/ ඉන්දික පෙරේරා/ තිළිණ දිසානායක/ මධුර ප්‍රභාත්/ සෙෂාන් රාජසේකර/ එරංග යාපා/ දිලුම් මුණසිංහ/ සුගත් සේනානායක/ මහේෂ් අධිකාරී/ දුලංජන අතපත්තු/ විජිත සේනාරත්න/ නුවන් පතිරණ යන මහත්වරුන්ටත් සියළුම ශාඛා අනු කණ්ඩායම් හා අනුබද්ධිත ආයතනවල සියලුම ආදී ශිෂ්‍යයින්ටත් සියලුම සාමාජිකයන්ටත් මාගේ නිල කාලයේ මා හටත් ආදී ශිෂ්‍ය සංගමයටත් ලබාදුන් සහයෝගය ස්තූති පූර්වකව මතක් කරමි.

2026/27 වර්ෂයේ පත්වන නව නිලධාරීමණ්ඩලයට සුභ පතන අතර , නැවත නැවතත් මලියදේව විද්‍යාලය මලියදේව ආදී ශිෂ්‍ය සංගමය හා මලියදේව නාමය දිනේවා!

යුරාජ් සරත්චන්ද්‍ර
ගරු ජ්‍යේෂ්ඨ උප සභාපති

ගරු සමලේකමිතුමාගේ වාර්තාව



- 2025/2026 වසර සඳහා නැවත වරක් මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සමලේකම් ධූරය භාරගන්නා ලෙස බොහෝ දෙනා කළ ඉල්ලීමට අනුව 2025 සැප්තැම්බර් මස 21 වන දින මහා සභාවේදී සම ලේකම් ලෙස තේරී පත් වූයෙමි.

- ගරු ක්‍රියාකාරී සභාපතිතුමාගේද උපදෙස් ලබාගෙන ප්‍රථම කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත අපගේ 2025/2026 වාර්ෂික සැලැස්ම ඉදිරිපත් කරන ලදී. මේ සඳහා ගරු භාණ්ඩාගාරික, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති සහ ගරු උප සභාපතිතුමන්ලා නිසි වේලාවට තම වාර්ෂික වැඩසටහන් ලබා දීම මහත් පිටුවහලක් විය.

- ආදි ශිෂ්‍ය සංගමයේ කාර්යාල කටයුතු සඳහා එක් සහයක නිළධාරිනියක පමණක් සිටීම නිසා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගින් නව සහයක නිළධාරීන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී.

- එම බඳවා ගැනීමෙන් පසුව 2024 වසර සිට දෙවසරකට අධික කාලයක් අඩාලව පැවති නව සාමාජික හැඳුනුම්පත් නිකුත් කිරීම සහ නැති වූ හෝ නම වෙනස් කිරීමේ හැඳුනුම්පත් නිකුත් කිරීම 2026 පෙබරවාරි වන විට ලබා දී අවසන් කළ හැකි විය.

- මේ වන විට නව සාමාජිකත්වයන් මාසික කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී අනුමත කළ පසු එළඹෙන මාසයේදී හැඳුනුම්පත සාමාජිකයා වෙත නිකුත් කිරීම සිදුවෙයි.

- අනුකණ්ඩායම් සහ අනුබද්ධිත ආයතන වෙනුවෙන් පවත්වාගෙන යන යාවත්කාලීන නොවූ ලිපිගොනු යාවත්කාලීන කිරීම ද පසුගිය වසර තුල සිදු කරන ලදී.

- ආදි ශිෂ්‍ය සංගමය ලෙස විද්‍යාලයේ අධ්‍යයන, ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු සඳහා දායකත්වය දක්වනවාට අමතරව සාමාජීය කටයුතු සඳහා ද දායකත්වය ලබා දෙයි. 2025 නොවැම්බර් මස ශ්‍රී ලංකාව මුහුණ දුන් "දිට්වා" සුළි කුණාටුව සමග විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දුන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් "සහන යාත්‍රා" වැඩසටහන ක්‍රියාත්මක කිරීම එවැනි අවස්ථාවකි. ආදි ශිෂ්‍ය සංගමයේ මෙහෙයවීමෙන් ප්‍රජා සහභාගීත්වය ඇතිව රු. පනස් ලක්ෂයකට අධික මුදලක් සහනාධාර ලෙස නිවාස අහිමි වූ සහ අවතැන් වූ ජනතාවට ලබා දීමේ මහඟ කර්තව්‍ය මෙහෙයවීමට හැකිවීම ගැන සතුටු වෙමි. මේ සඳහා සුබසාධක අනුකාරක සභා සභාපති දුලංජන අතපත්තු සොයුරා ඇතුළු සුබසාධක සංගමය විශේෂ දායකත්වයක් ලබා දුනි.

- සාමාජිකයන් සඳහා ව්‍යාපෘති ශ්‍රම දායකත්ව ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදය යාවත්කාලීන කිරීම 2024/2025 ලේකම්තුමන් ආරම්භ කර තිබූ අතර එය තවදුරටත් වැඩිදියුණු කර පවත්වාගෙන යා හැකි විය. මේ සඳහා ආදී ශිෂ්‍ය J.G.D.A. තිලකරත්න සොයුරා මෙවරද ස්වේච්ඡාවෙන් කටයුතු කරන ලදී.

- වසර ගණනාවක් පුරා විද්‍යාලයෙන් පත්වන සම ලේකම් ලෙස කටයුතු කළ සරත් රත්නායක සොයුරා ස්ථාන මාරු ලබා පාසලෙන් නික්ම යාම අප සංගමයට වූ බලවත් පාඩුවකි. සරත් රත්නායක සොයුරා ආදි ශිෂ්‍ය සංගමය සහ පාසල සම්බන්ධීකරණය කඩිනමින් හා ඉතා මැනවින් කරමින් අපගේ කටයුතු පහසු කරන ලදී.

- සරත් රත්නායක සොයුරා නික්ම යාමෙන් පසුව එම තනතුර භාර ගැනීමට ආදි ශිෂ්‍ය ගුරු භවතෙක් ඉදිරිපත් නොවීම කණගාටුදායකය. 96 කණ්ඩායමේ තෙන්නකෝන් සොයුරා සාමාජික අයදුම්පත් පාසල මගින් තහවුරු කර දීම ස්වේච්ඡාවෙන් කිරීම අගය කළ යුතුය.

ගරු සමලේකමිතුමාගේ වාර්තාව

- සරත් රත්නායක මහතාගේ නික්ම යාමෙන් පසුව කෘත්‍යාධිකාරී මණ්ඩල සභා වාර්තා සටහන් කිරීම, ලිපි ලේඛණ සැකසීම ආදිය සඳහා උප ලේකම් සුගත් සේනානායක සොයුරා දැක් වූ දායකත්ව පැසසිය යුතුය. එමෙන්ම මේ සඳහා උප සභාපති දුලංජන අතපත්තු සොයුරාගේ ද නොමද සහයෝගය ලැබුණි.

- ඒ සමගම උපලේකම් සුගත් සේනානායක මහතා 2027 පළමු ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීම සම්බන්ධීකරණය සහ ආදි ශිෂ්‍ය ඝණයේ ලකුණු සැකසීම සඳහා වූ දායකත්වය අගය කරමි.

- සමලේකම් ලෙස පත් වූ මා හට 2026 මහා ක්‍රිකට් තරගය සහ එක්දින තරගය සංවිධානය කිරීමේ කමිටුවේ ප්‍රධානියා ලෙස ද කටයුතු කිරීමට ගරු ක්‍රියාකාරී සභාපතිතුමා ඉල්ලා සිටි අතර තනතුරු දෙකෙහිම කටයුතු නිසි ලෙස ඉටුකරමින් එම අභියෝගාත්මක මහා ක්‍රිකට් තරගය ද සාර්ථකව සංවිධානය කිරීමට හැකිවීම පිළිබඳ සතුටු වෙමි. මෙය වඩාත් අභියෝගාත්මක වූයේ එතෙක් පැවති දෙදින මහා ක්‍රිකට් තරගය 2026 වසර සිට තුන්දින තරගයක් ලෙස පැවැත්වීමට ආරම්භ කිරීමයි. මේ නිසා එක් සති අන්තයක තුන්දින තරගය පැවැත්වීමට සහ ඊලග සති අන්තයේදී එක් දින තරගය පැවැත්වීමට සිදුවිය. මෙම සියළු අභියෝගයන් ජය ගනිමින් ආදි ශිෂ්‍ය සංගමය වෙත රු. ලක්ෂ 66 ක පමණ ශුද්ධ ආදායමක් ලබා ගැනීමට හැකි විය. මේ වෙනුවෙන් ඇපකැප වූ අනුශාසකතුමන්ලා, ගරු ක්‍රියාකාරී සභාපතිතුමා ඇතුළු නිළධාරී මඩුල්ලටත්, සංවිධාන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කල ක්‍රීඩා උප සභාපති ඉන්දික පෙරේරා මහතා ඇතුළු සියළු දෙනාටත් ස්තූතිවන්ත වෙමි.

- 2025/2026 වසර ආරම්භයේ දී පාසල් සංවර්ධන කමිටුව නියෝජනය කිරීමට සම ලේකම් ලෙස මා සහ භාණ්ඩාගාරික සුරේෂ් ආනන්ද මහතාව කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තෝරා ගන්නා ලදී. එහෙත් 2026 පෙබරවාරි මස දී මාගේ සේවා ස්ථානය වෙනස් වීම නිසා පාසල් සංවර්ධන කමිටුව නියෝජනය කිරීමෙන් ඉවත් වීමට සිදුවීම ගැන කණගාටු වෙමි. ඉන්පසු 2026 මාර්තු මස සිට පාසල් සංවර්ධන කමිටුව නියෝජනය කිරීමට ඉදිරිපත් වූ ජයන්ත අභයරත්න සොයුරා වෙත ගෞරව පූර්වක ස්තූතිය පුද කර සිටිමි.

- ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු සඳහා ගරු විදුහල්පති W.M.C.K මහමිතව මැතිතුමා ප්‍රමුඛ නියෝජ්‍ය විදුහල්පතිවරු, අංශ ප්‍රධානීන්, ක්‍රීඩා පාලක සහ ක්‍රීඩා භාර ආචාර්යවරු ඇතුළු ආචාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය ස්තූති පුර්වකව සඳහන් කරමි.

- කාර්යාල කටයුතු සහ රැස්වීම් කටයුතු ආදිය සඳහා තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක නුවන් පතිරණ සොයුරා ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කරන ලදී. නුවන් පතිරණ සොයුරාට මාගේ සුවිශේෂී ගෞරවාදර ස්තූතිය පුදකර සිටිමි.

- එමෙන්ම මාධ්‍ය සම්බන්ධීකාරක විජිත සේනාරත්න සොයුරා මහා ක්‍රිකට් තරගයෙහි සමරු කලාපය සහ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ සමරු කලාපය සකස් කිරීම, සෝදුපත් බැලීම සහ ප්‍රමිතිගත මුද්‍රණය වෙනුවෙන් ඉතා වෙහෙස වී කටයුතු කිරීම පිළිබඳව මාගේ ස්තූතිය පල කරමි.

- එමෙන්ම 2027 වසර සඳහා පලමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නියෝජිතයා ලෙස පැකිලීමකින් තොරව ඉදිරිපත් වූ ප්‍රසංග රත්නායක සොයුරාට ද ස්තූතිය පල කර සිටිමු.

- එමෙන්ම පසුගිය වසරක කාලය තුල කටයුතු කිරීමේදී ගරු අනුශාසකතුමන්ලා, ගරු ක්‍රියාකාරී සභාපතිතුමා, ජ්‍යෙෂ්ඨ උප සභාපතිතුමා, භාණ්ඩාගාරිකතුමා, උප සභාපතිතුමන්ලා ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සියළු දෙනාගෙන් ලැබුණු සහයෝගයට මාගේ ගෞරවය පුදකර සිටිමි.

වෛද්‍ය නිසර පෙරේරා
සම ලේකම්

ගරු භාණ්ඩාගාරිකතුමාගේ වාර්තාව



2025 - 2026 වර්ෂය තුලදී මලියදේව ආදි ශිෂ්‍ය සංගමයේ 19 වන භාණ්ඩාගාරික ලෙස පත්වූ මා ලැබූ අභියෝග හා අත්දැකීම් වලින් පිරුණු වර්ෂයක් ලෙස මා ලැබූ පන්නරය ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාවක් ලෙස සලකමි.

➢ **සංගමයේ මූල්‍ය කටයුතු සිදුවන ආකාරය හා බැංකු පිළිබඳ විස්තර**

අප ආදි ශිෂ්‍ය සංගමයේ සියලුම ගිණුම් කටයුතු හා ගනුදෙනු තීරණ වන ආකාරය ලේඛණගත කර ඇති අතර මෙහි මූල්‍ය වාර්ථා සම්මත ගිණුම් ක්‍රමයට අනුකූලව පවත්වාගෙන යනු ලබයි.

1)	විගණන සමාගම	:	Earnst & Young
2)	ගිණුම්කරණ කටයුතු	:	INTA ACC.
3)	තොග පාලනය	:	INTA. POS BILLING SYSTEM
4)	සාමාජික දත්ත	:	INTA POS. (WEB SYSTEM)
5)	පොත් තැබීම හා බැංකු විශ්ලේෂණය	:	Biz care

➢ **2025 - 2026 වර්ෂයේ ආදායම**


- නව සාමාජිකයන් මගින් - රු. 1,483,500.00
- ආදි ශිෂ්‍යයන්ගේ සහ අනුග්‍රාහකයන්ගේ පරිත්‍යාග සහ අනෙකුත් ආදායම් - රු.31,660,991.00
- ආදි ශිෂ්‍ය සංගමය මගින් අලෙවි කරන භාණ්ඩ හරහා - රු. 8,262,775.00
- වාර්ෂික අරමුදල් ඉපැයීමේ ප්‍රධාන ව්‍යාපෘතිය - රු. 5,626,000.00
- අනෙකුත් ආදායම් (බැංකු පොලි) - රු 6,000,847.00

➢ **2025 - 2026 සඳහා වියදම**

- විද්‍යාලයේ සිසුන් සඳහා ලබාදුන් ශිෂ්‍යත්ව සඳහා - රු. 515,000.00
- මලියදේව විද්‍යාලයේ අධ්‍යාපන සංවර්ධනය සඳහා - රු. 629,306.00
- මලියදේව විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා - රු. 454,392.00
- ක්‍රීඩා හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා - රු. 10,964,907.00
- ආදි ශිෂ්‍යයන් වෙනුවෙන් සිදු කල ව්‍යාපෘති සඳහා - රු. රු. 17,449,489.00
- සුභ සාධක කටයුතු සඳහා - රු.9,777,468.00

ගරු භාණ්ඩාගාරිකතුමාගේ වාර්තාව





- මේ වර්ෂය සඳහා අප විසින් ගිණුම්කරණ කටයුතු පහසුව සඳහා අප සංගමය පොත් තැබීම හා බැංකු සැසඳුම් අඛණ්ඩව කරගෙන යාමට කටයුතු කිරීම. කාලයක් පැවති ගිණුම්කරණ පද්ධතියේ අඩුපාඩුවක්ව පැවති INTA Acc System වෙනුවට Quick Book System හඳුන්වා දීම. භාණ්ඩ අලෙවිය හා තොග පාලනය සඳහා Bar Code ක්‍රමය හඳුන්වා දී කටයුතු කරගෙන යාම.

ස්තූතිය

- ගරු විදුහල්පතිතුමා, නියෝජ්‍ය විදුහල්පතිවරු/ විදුහල්පතිවරියන් ඇතුලු සියලු ආචාර්යය මණ්ඩලයට
- ආදි ශිෂ්‍ය සංගමයේ සියලුම වර්තමාන සහ හිටපු අනුශාසකවරුන්ට, වර්තමාන ගරු සභාපති ඉංජිනේරු ධම්මික තත්තිරිමලගේ මහතා සහ හිටපු සියලුම සභාපතිවරුන්ට, වර්තමාන ගරු සමලේකම්වරුන් වන තිසර පෙරේරා මහතා සහ සරත් රත්නායක මහතාට සහ පැරණි සම ලේකම්වරුන් වන ශමීන් ජයතුංග, ජයන්ත අබේරත්න යන මහත්වරුන්ටත් මා සමග උරෙන්දර ගැටෙමින් කටයුතු කළ මා මිතු ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති යුරාජ් සරත්චන්ද්‍ර මහතාටද, ගරු උපසභාපතිවරුන් වන රනේෂ් කුරේ, දිලුම් මුණසිංහ, එරංග යාපා, තිළිණ දිසානායක, මදුර අමරතුංග, ෂෙශාන් රාජසේකර, දුලංජන අතපත්තු, ඉන්දික පෙරේරා මහත්වරුන්ට, උප භාණ්ඩාගාරික මහේෂ් අධිකරි මහතාට, උප ලේකම් සුගත් සේනානායක මහතාට සහ මාධ්‍ය සම්බන්ධීකාරක විජිත සේනාරත්න මහතාට, තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක නුවන් පතිරණ මහතාටද වර්තමාන අභ්‍යන්තර විගණක රවී ධර්මසේකර ඇතුළු සියලුම විගණකවරුන්ටද මාත් සමග පසුගිය වර්ෂයන් පුරාවටම කටයුතු කළ සියලුම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයින් ඇතුලු සියලු ආදි ශිෂ්‍ය සොයුරන්ට
- වර්තමාන භාණ්ඩාගාරික ධූරය දක්වා ඒමට අවශ්‍ය ශක්තිය ලබා දුන් 96 කණ්ඩායමේ චතුර තෙන්නකෝන්, යුරාජ් සරත්චන්ද්‍ර, ටී.සී.ජේ සිල්වා ඇතුලු සියලුම 96 සොයුරන්ට
- පාසල් සංවර්ධන සමිතියේ වර්තමාන විධායක කමිටු සහ පැරණි විධායක කමිටු සාමාජිකයන්ට, නිලධාරි මණ්ඩලයට, විද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට, ක්‍රීඩා පුහුණුකරුවන්ට, ආදි ශිෂ්‍ය සංගමයේ භාණ්ඩ හා සේවා සපයන්නන්ට
- E & Y විගණන සමාගමේ නිලංග දහනක මහතා ඇතුලු කළමනාකාරිත්වයට සහ සියලුම නිළධාරීන්ට, Bizcare Solution ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ හර්ෂ ගමගේ මහතා ඇතුලු සියලුම නිළධාරීන්ට

ගරු භාණ්ඩාගාරිකතුමාගේ වාර්තාව

- Inta Hub ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ 96 කණ්ඩායමේ දිමුත් දුණුසිංහ මහතා ඇතුලු නිළධාරීන්ට, ආදි ශිෂ්‍ය සංගමයේ නිල බැංකු ගිණුම් පවතින බැංකුවල සියලුම නිළධාරීන්ට, විද්‍යාලයේ දරුවන්ට, දෙමාපියන්ට සහ සුභ පතන්නන්ට.
- එමෙන්ම භාණ්ඩාගාරික මාගේ සියලු ලිපි ලේඛණ කටයුතු සිදු කල ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලයේ වර්තමාන නිලධාරියන් වන සෞම්‍යා අධිෂානි, කවීෂා විජේරත්න සහ කවීෂා නවෝදනී මෙනවියන් සහ හිටපු නිලධාරිනියන්ට
- මාගේ නිල කාලය තුළ ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු බාධාවකින් තොරව සිදුකර ගෙන යාමට ශක්තිය ලබා දුන් මාගේ ආදරණීය බිරිඳ ශ්‍යාමි කුමාරසිංහ සහ පුතුන් දෙදෙනා වන රදින් පුංචිහේවා සහ මින්දුල පුංචිහේවා සහ පවුලේ සියලු දෙනාට සහ ඉහත නම් කී නොකී සියලුම දෙනාහට මාගේ විශේෂ හෘද්‍යාංගම ස්තූතිය පුද කර සිටිමි.

මාගේ ආදරණීය මලිදෙව් මාතාව සදාකල් දිනේවා..!

සුරේෂ් ආනන්ද
භාණ්ඩාගාරික

අනුකාරක සභා වාර්තා

මුදල් අනුකාරක සභාව



ගරු උප සභාපති
එරංග යාපා



ගරු ලේකම්
රජින්ත යටවර

- 2025/2026 වර්ෂය තුළ මලියදේව ආදි ශිෂ්‍ය සංගමයේ මූල්‍ය ශක්තිමත්භාවය වර්ධනය කිරීම, ආදායම් මාර්ග පුළුල් කිරීම, භාණ්ඩ කළමනාකරණය විධිමත් කිරීම සහ අනාගත මූල්‍ය තිරසාරභාවයට අදාළ පදනම ගොඩනැගීම යන අරමුණු පෙරදැරි කරගත් ව්‍යාපෘති සැලැස්මක් මුදල් අනුකමිටුව විසින් සාර්ථකව ක්‍රියාවට නංවන ලදී.
- මුදල් අනුකමිටුව පත් කිරීමෙන් අනතුරුව ප්‍රථමයෙන් සිදු කරනු ලැබුවේ විකිණීම සඳහා පවතින සියලු භාණ්ඩ පිළිබඳ සවිස්තරාත්මක ගණනය කිරීමයි. එම ගණනය කිරීමේ ප්‍රතිඵල විගණන කමිටුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. මෙය සංගමයේ භාණ්ඩ පාලනය හා මූල්‍ය විනිවිදභාවය තහවුරු කිරීම සඳහා වැදගත් පියවරක් විය.
- ඉන් අනතුරුව සියලු භාණ්ඩ පරිගණක ගතකර ක්‍රමානුකූල දත්ත පද්ධතියක් තුළ ලේඛනගත කරන ලදී. එමඟින් භාණ්ඩ අලෙවිය, තොග පාලනය සහ වාර්තාකරණ කටයුතු වඩාත් කාර්යක්ෂම හා නිවැරදි අයුරින් සිදු කිරීමට හැකි විය.
- පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ අවස්ථාවට සමගාමීව දින දෙකක කාලයක් වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාමට මුදල් අනුකමිටුව කටයුතු කළේය. මෙම වැඩසටහන මඟින් වාර්තාගත රු. 269,000 කට අධික ආදායමක් උපයා ගැනීමට හැකි වූ අතර එය වසරේ ආදායම් වැඩි කිරීමේ සාර්ථක ආරම්භයක් විය.
- ඉන් පසුව මුදල් අනුකමිටුවේ වාර්ෂික ප්‍රධාන අරමුදල් රැස්කිරීමේ වැඩසටහන වන Quadrafest වැඩසටහන සාර්ථකව සංවිධානය කරන ලදී. වැඩසටහන සඳහා හෝටලයේ ප්‍රමාණවත් ඉඩකඩ වෙන් කරගැනීම, සංගීත කණ්ඩායම් දෙකක සහභාගීත්වය සහ උසස් සංවිධානමය සැලසුම් හේතුවෙන් මෙම වැඩසටහන ඉතාමත් සාර්ථක අයුරින් පැවැත්විණි. එමඟින් රුපියල් ලක්ෂ 36ක ආදායමක් ලැබුනු අතරම සංගමයේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට විශාල දායකත්වයක් සැපයීය.
- විදුහලේ වාර්ෂික ක්‍රීඩා උත්සවයට සමගාමීව පවත්වන ලද වෙළෙඳ කුටියද තවත් සාර්ථක ව්‍යාපෘතියක් විය. මෙම වැඩසටහන මඟින් රු. 359,950 ක වාර්තාගත අලෙවි ආදායමක් උපයා ගැනීමට හැකි වූ අතර, පෙර වසරවල ප්‍රතිඵල අභිබවා යන මට්ටමකට ආදායම් වර්ධනය දැක්විය.
- වාර්ෂික මහා ක්‍රිකට් තරගාවලියට සමගාමීව දින හතරක් පුරා පැවැත්වූ වෙළෙඳ කුටි වැඩසටහන මුදල් අනුකමිටුවේ තවත් සුවිශේෂී ජයග්‍රහණයක් විය. මෙම වැඩසටහන මඟින් රු. 1,362,968 ක වාර්තාගත ආදායමක් උපයා ගැනීමට හැකි වූ අතර, එක්දින තරගාවලිය පැවැති දිනයේ පමණක් රු. 743,100 ක ආදායමක් ලබාගැනීමට හැකි විය. මෙය සංගමයේ ඉතිහාසයේ වාර්තාගත ආදායම් මට්ටමක් ලෙස සටහන් විය.
- මූල්‍ය වර්ෂය අවසානයේදී විකිණීමට පවතින සියලු භාණ්ඩ නැවත ගණනය කර නිසි ක්‍රමවේදයට අනුව භාරදීමේ කටයුතු සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය විගණන කමිටුව සහ අදාළ විගණන ආයතනයේ අධීක්ෂණය යටතේ සිදු කිරීම මඟින් විනිවිදභාවය සහ වගකීම තවදුරටත් තහවුරු කරන ලදී.
- එමෙන්ම භාණ්ඩ අලෙවිය තවදුරටත් නවීකරණය කිරීම සඳහා සෑම භාණ්ඩයකටම QR කේතයක් හඳුන්වා දී, එම කේතය මඟින් භාණ්ඩ හඳුනාගත හැකි මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කරන ලදී.

අනුකාරක සහ වාර්තා

එම පද්ධතිය හරහා අලෙවි කටයුතු සිදු කිරීම නිසා තොග පාලනය, අලෙවි නිරීක්ෂණය සහ මූල්‍ය වාර්තාකරණය ඉතා ඉහළ නිරවද්‍යතාවයකින් පවත්වාගෙන යාමට හැකි විය.

- අනුකමිටුව මුහුණ දුන් තවත් ප්‍රධාන අභියෝගයක් වූයේ භාණ්ඩ ගබඩා කිරීම සහ අලෙවිය සඳහා සුදුසු ස්ථානයක් සකස් කිරීමයි. ඒ සඳහා පහළ මඩවල වලව්වේ පවතින පැරණි ආදි ශිෂ්‍ය සංගම් කාර්යාල පරිශ්‍රයේ කොටසක් තෝරාගෙන නවීකරණය කරන ලදී. භාණ්ඩ වර්ගීකරණය, ප්‍රදර්ශනය සහ පාරිභෝගික පහසුව සැලකිල්ලට ගනිමින් එය අලංකාර සහ කාර්යක්ෂම වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කරන ලදී.
- මෙම නව වෙළෙඳ පරිශ්‍රය ආරම්භ කිරීමෙන් අනතුරුව වෙළෙඳ කුටියේ මාසික ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට හැකි වූ අතර, එය මලියදේව ආදි ශිෂ්‍ය සංගමයේ දිගුකාලීන ආදායම් වර්ධනය සඳහා වැදගත් සාධකයක් බවට පත් විය.
- අවසාන වශයෙන්, වසර පුරා මුදල් අනුකමිටුවේ සියලු කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් සියලු සාමාජිකයින්ට, මාර්ගෝපදේශනය හා උපදෙස් ලබා දුන් සභාපතිතුමා, ලේකම්තුමා, භාණ්ඩාගාරිකතුමා, ජ්‍යෙෂ්ඨ උප සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සහ අපගේ වෙළෙඳ කටයුතු සඳහා සහය දැක්වූ සියලු දෙනාට විශේෂ ස්තුතිය පිරිනමන්නෙමු.
- මුදල් අනුකමිටුව විසින් 2025/2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන් සහ පද්ධතිමය වැඩිදියුණුව හරහා සංගමයේ ආදායම් මට්ටම සැලකිය යුතු ලෙස ඉහළ නංවා මූල්‍ය ස්ථාවරත්වය සහ තිරසාරභාවය ශක්තිමත් කිරීමට සාර්ථකව දායක වී ඇත.

ක්‍රීඩා හා විෂය බාහිර ක්‍රියාකාරකම් අනුකාරක සභාව



ගරු උප සභාපති
ඉන්දික පෙරේරා



ගරු ලේකම්
තාරක චන්ද්‍රසේකර


- 2026 මලියදේව, ශාන්ත ආනා මහා ක්‍රිකට් තරඟය හා එක් දින තරඟය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධානත්වයෙන් ඉතා උත්කර්ෂවත් අන්දමින් වෙලගෙදර ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී. මෙවර ටෙස්ට් තරඟය ප්‍රථම වතාවට තෙදින තරඟයක් ලෙස පැවැත්වීමට හැකි විය.
- 2026 වසරේ වාර්ෂික මළල ක්‍රීඩා උළෙල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන අනුග්‍රාහකත්වයෙන් පවත්වන ලදී. මේ සඳහා රු. 1,300,000/- ක පමණ මුදලක් වැය කරන ලදී. උත්සවයේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලාන, බයිසිකල් තෑග්ග, කේක් තෑග්ග සහ ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා ඇඳුම් සඳහා ද අප විදුහලේ ආදී සිසුන්ගේ දායකත්වයෙන් ලබාදුන් අතර, අනුකණ්ඩායම් මඟින් ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.
- මෙවරත් මලිදෙව් පුවත් සඟරාව සඳහා උඩවත්ත ප්‍රින්ටර්ස් ආයතනය පූර්ණ අනුග්‍රහකත්වය ලබාදුන් අතර 95 ආදී අනුකණ්ඩායම රු. 700,000/- ක මුදලක් උත්සවය සඳහා ලබා දෙන ලදී.
- මෙවරත් සුපුරුදු පරිදි ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා රු. 5,000,000/- ක පමණ මුදලක් ලබාදෙන ලදී.
- බැඩ්මින්ටන්, පැසිපන්දු හා ක්‍රිකට් කණ්ඩායම් සඳහා දෙස් විදෙස් පුහුණුකරුවන්ගේ සේවාව ලබාගෙන පුහුණු කඳවුරු පැවැත්වීම.

අනුකාරක සභා වාර්තා

















අනුකාරක සභා වාර්තා

සාමාජික අනුකාරක සභාව



ගරු උප සභාපති
සෙෂාන් රාජසේකර



ගරු අනු කමිටු ලේකම්
ලහිරු මුතුගල

- 2025/2026 නිල වර්ෂයේ සාමාජික අනු කමිටුවේ උප සභාපති ලෙස සෙෂාන් රාජසේකර මහතාද ලේකම් ධූරය වෙනුවෙන් ලහිරු මුතුගල මහතාද කටයුතු කරන ලදි.
- අප ආදි ශිෂ්‍ය සංගමයට නිරතුරුවම ශක්තියක් වන අනු කන්ඩායම් ආදි ශිෂ්‍ය සංගමය හා ලියාපදිංචිය පසුගිය වසර වල මන්දගාමීව පැවතුණි.
- 2025/2026 නිල වර්ෂයේ සාමාජිකයින් 192 ක් පමණ ආදි ශිෂ්‍ය සංගමයට ඇතුළත් කර ගැනීමට හැකිවිය. අප ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් එම නව සාමාජිකයින් සාදරයෙන් පිලි ගන්නා අතර ඔවුන් අප ආදි ශිෂ්‍ය සංගමයේ හා මලියදේව විද්‍යාලයේ කීර්තිය හා අභිවෘද්ධිය සඳහා කැපවෙනු ඇතැයි නුදෙක් බලාපොරොත්තු වෙමු.
- ආදි ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කරන කටයුතු සඳහා වැඩි සහභාගිත්වයක් ලබා ගැනීමේ අපේක්ෂාව ඇතුව සාමාජිකයින්ගේ සමගිය හා සහජීවනය වර්ධනය කර ගැනීම උදෙසා සභාපති කුසලාන ක්‍රිකට් තරඟාවලිය - විද්‍යාලයීය ක්‍රිකට් ක්‍රීඩාංගනයේදී ක්‍රීඩකයින් 300කට අධික සහභාගිත්වයකින් යුතුව 2025 දෙසැම්බර් මස 08 වන දින සාර්ථකව පැවැත්විණ.

අධ්‍යාපන අනුකාරක සභාව




ගරු උප සභාපති
මධුර ප්‍රභාත් අමරතුංග



ගරු ලේකම්
මාධව වික්‍රමරත්න

2025/2026 වසර සඳහා මලියදේව ආදී ශිෂ්‍ය සංගමයේ අධ්‍යාපන අනුකමිටුවේ සභාපති වශයෙන් D.M. මධුර ප්‍රභාත් අමරතුංග මහතා පත් වූ අතර ලේකම් වශයෙන් R.A.A. මාධව වික්‍රමරත්න මහතා පත් කරගන්නා ලදී.

අධ්‍යාපන අනුකමිටුවේ පළමු ව්‍යාපෘතිය ලෙස සෑම වසරකදීම මුද්‍රණය කර ලබා දෙන ''මලිදෙව් සිරිත'' පොත මුද්‍රණය කර සියලුම එක වසර සහ හය වසර සඳහා අලුතින් පාසලට එකතු වූ දරුවන් වෙනුවෙන් ඔවුන් පාසලට භාරගන්න දිනයේදී ලබා දෙන ලදී. මෙහිදී පොත් 370 ක් මුද්‍රණය කිරීම සඳහා රුපියල් 84 360 ක මුදලක් වැය වූ අතර ප්‍රාථමික අංශයේ සියලුම ගුරුවරුන් ඇතුලත් කරමින් මෙම පොතට එකතු කරන ලද පින්තූරය සඳහා රුපියල් 3000 ක මුදලක් වැය වන ලදී.




මෙම වසරේදී පාසලේ ප්‍රාථමික අංශයේ දරුවන්ගේ ඉංග්‍රීසි භාෂාව වැඩි දියුණු කිරීම සඳහා ''මලිදෙව් ශිල්පාලෝක" වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන ගිය වසරේදී ගරු සභාපතිතුමා විසින් අධ්‍යාපන දායකත්ව වැඩසටහනක් ලෙස යෝජනා වූ අතර මෙම වසරේදී මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රාථමික අංශයේ 1 වසර සිට 5 වසර දක්වා සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව දියුණු කිරීම උදෙසා ඊට ගැලපෙන සුදුසුකම් ඇති ගුරුවරියන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. එම ව්‍යාපෘතිය අධ්‍යාපන අනුකමිටුව හා සම්බන්ධව ඉතාමත් සාර්ථකව කරගෙන යන අතර මෙම ව්‍යාපෘතියේ වියදම් පියවා ගැනීම වෙනුවෙන් රුපියල් 500,000 ක අනුග්‍රහකත්ව මුදලක් ද ලැබී ඇත.





මෙම වසරේදී පාසලේ සියලුම ගුරුවරුන් සහ ගුරුවරියන් උදෙසා ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහනක් සිදු කරන ලදී. "Mind Shift" ලෙස සිදු කරන ලද මෙම වැඩ සටහන Asliya Golden Cassandra හොටෙල් පරිශ්‍රයේ දී පැවැත්වූ අතර උදැසන වැඩසටහන දිවයිනේ ඉතාමත් ජනප්‍රිය වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන මහතා විසින් පැවැත්වූ අතර සහභාගී වූ සියලුම දෙනාට උදෑසන තේ පැන් සංග්‍රහය මෙන්ම දිවා ආහාරය ද සවස තේ පැන් සංග්‍රහයද ලබා දෙන ලදී. සවස වරුවේ වැඩසටහන Dr. සනත් විමලසිරි මහතා විසින් මෙහෙයවන ලදී. මෙම වැඩසටහනට 200 ට වැඩි පිරිසක් සහභාගී වූ අතර රුපියල් 6 55 000 ක මුදලක් මෙම වැඩසටහනට වැය කරන ලදී. එමෙන්ම රුපියල් 3 15 000 ක මුදලක් අනුග්‍රහකත්ව ලෙස සොයා ගැනීමට හැකි විය.







මෙම වසරේදී ශිෂ්‍යත්ව විභාගය සඳහා මුහුණ දෙන අප පාසලේ දරුවන්ට ශිෂ්‍යත්ව විභාගය සාර්ථක කර ගැනීම සඳහා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහනක් සිදු කරන ලදී. අධ්‍යාපන අනුකමිටුවේ ආරාධනයෙන් ලංකා බැංකුව හා සම්බන්ධව ළමුන් 500 සඳහා මෙම වැඩසටහන සිදු කරන ලද අතර 4 වසර සිසුන්ද මෙම

අනුකාරක සහා වාර්තා

වැඩසටහනට හැකි අයුරින් සම්බන්ධ කර ගැනීමට හැකි විය. වැඩසටහනට පෙරදින පෙරහුරුවක් ලෙස ළමුන්ට විභාගයේ ආකාරයෙන්ම එම ප්‍රශ්න පත්‍රය ලිවීමට කටයුතු කල අතර එම ප්‍රශ්න පත්‍ර ගුරුවරුන් ලවා පරීක්ෂා කරවා වැඩසටහන දින සාකච්ඡා කරන ලදී. මේ සඳහා අප පාසලේ ගුරුවරුන් දෙදෙනෙකු සම්බන්ද කරගනිමින් වැඩ සටහන සිදු කරන ලදී. මෙහිදී දරුවන් සියලුම දෙනාට ප්‍රශ්න සහ පිළිතුරු පත්‍ර 6 බැගින් කට්ටල 500 ළමුන් 500 ට ලබා දීමට හැකි විය. තවද වැඩසටහන දින දරුවන් වෙනුවෙන් උදැසන සංග්‍රහයක්ද ලංකා බැංකුව මගින් සිදු කරන ලදී.

එමෙන්ම මෙම ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහනට සමගාමිව එම දරුවන්ගේ දෙමාපියන් වෙනුවෙන් දරුවන්ගේ ආරක්ෂාව සහ විෂ මත්ද්‍රව්‍ය වලින් දරුවන් ගලවා ගැනීම පිළිබඳව වැඩසටහනක් ලංකා බැංකුව සම්බන්ධ කරගනිමින් සිදු කරන ලදී. මේ සඳහා කළුතර ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අපරාධ ස්ථාන පරීක්ෂණ පුහුණු සංකීර්ණයේ ස්ථානාධිපති චාමර විජේරත්න මහතා සම්බන්ධ වූ අතර ඉතාමත් වටිනා වැඩසටහනක් පැය දෙකකටත් වැඩි කාලයක් සිදු කරන ලදී.

මෙම සම්පූර්ණ වැඩසටහන ලංකා බැංකුවේ පූර්ණ අනුග්‍රහය යටතේ සිදු කරන ලද අතර මෙම වැඩසටහනට ආදී ශිෂ්‍ය සංගමයේ මුදල් වැය කිරීමට අවශ්‍ය නොවූ අතර මෙම වැඩසටහන මෙහෙය වූ සහ එදින පැමිණ සිටි ලංකා බැංකු කාර්යය මණ්ඩලයට වැඩසටහනෙන් පසුව ආදී ශිෂ්‍ය සංගමය මගින් සංග්‍රහයක් ලබා දෙන ලදී.











අධ්‍යාපන අනුකමිටුවේ ව්‍යාපෘතියක් වන ප්‍රාථමික අංශයේ දරුවන්ට හොඳ පුරුදු පුහුණු කරවීම උදෙසා "Good Habits & Bad Habits" "Good Touch & Bad Touch" වැඩසටහන පසුගිය කාලය පුරාවට පන්ති මට්ටමින් සිදු කරන ලදී. මෙය ප්‍රාථමික අංශයේ දරුවන්ගේ ඉංග්‍රීසි භාෂාව වැඩි දියුණු කිරීම සඳහා බදවාගත් ගුරුවරියන් දෙදෙනා ද පාසලේ දරුවන්ගේ උපදේශනය සම්බන්ධව කටයුතු කරන ගුරු මහත්මියද සම්බන්ධ කරගනිමින් සිදු කරන ලදී. මෙහිදී යම් ක්‍රියාකාරම් ද නාට්‍යමය ඇසුරින්ද යම් ආකෘති සහ අනුරූප යොදා ගනිමින් විවිධ ක්‍රියාකාරම් යොදා ගනිමින් සිදු කරන ලදී.




අධ්‍යාපන අනුකමිටුවේ ව්‍යාපෘතියක් වන "Positive Attitude Development" වැඩසටහන අප පාසලේ 10 වසර සහ 11 වසර ළමුන් සඳහා සාර්ථක අන්දමින් සිදු කරන ලදී. මේ සඳහා දිවයිනේ ජනප්‍රිය දේශක ශාස්ත්‍රපති වරලත් මනෝ විද්‍යා උපදේශක පොලිස් පරීක්ෂක මධුමාල් ගමගේ මහතා සම්බන්ධ වූ අතර පැය 3 ක් පුරාවට දරුවන්ගේ ආකල්ප වැඩි දියුණු කිරීමට අදාල වූ සාර්ථක දේශනයක් පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා රුපියල් 60,000 ක මුදලක් වැය වූ අතර රුපියල් 75,000 ක අනුග්‍රාහයක් ලැබී ඇත.







මෙම වසර සඳහා තවත් මෙවැනි ව්‍යාපෘති කීපයක්ම සුදානම් කර තිබූ අතර 2025 වසරේ අවසානයේදී සිදු වූ දිට්වා සුළි කුණාටුව සමග සියලුම අනුකමිටුව වල ව්‍යාපෘති දිනයන් වෙනස් කිරීමට සිදු විය. පාසලේ පැවැත්වෙන විභාග කාල සටහන් සහ අනිකුත් වැඩසටහන් සමග පහත ව්‍යාපෘති වලට දින ලබා ගැනීම සහ එම ව්‍යාපෘති සුදානම් කරගැනීමට කාලය සීමා වීම සහ තවත් හේතු කරනා හේතුවෙන් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

- AI / Robotics & Innovation Conference & Exhibition
- Olympiad Exams in Sri Lanka preparation
- Toastmasters Public Speaking Programme
- English Debate & Speech Club
- Junior Talent Day
- O/L Motivation & Goal Setting Programme
- O/L Past Papers & Subject Revision Programme
- A/L Pass Papers & Subject Revision Programme
- Physics & Chemistry Practical Session

අවසාන වශයෙන් අධ්‍යාපන අනුකමිටුව තුල වෙහෙස මහන්සි වී කැප වී ශ්‍රමයෙන් මෙන්ම අනුග්‍රහකත්ව ද ලබා දෙමින් හැකි අයුරින් උපකාර කල සියලුම දෙනාටද නිලධාරි මණ්ඩලයේ සියලුම දෙනාටද අධ්‍යාපන අනුකමිටුවේ ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට සහය දුන් සියලුම දෙනාටද ස්තුතිවන්ත වෙමු.

අනුකාරක සභා වාර්තා

වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනික මාර්ගෝපදේශක අනුකාරක සභාව



ගරු උප සභාපති
රනේෂ් කුරේ



ගරු ලේකම්
චතුමාල් චන්ද්‍රසිරි මහතා

Conducted Projects

1. "Next Gen Devans" විද්‍යාත්මක මාර්ගෝපදේශන වැඩසටහන

2003 කණ්ඩායමේ අනුග්‍රහය ඇතිව, 2026 ජනවාරි 23 දින මලියදේව විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී "Next Gen Devans" විද්‍යාත්මක මාර්ගෝපදේශන වැඩසටහන සාර්ථකව පැවැත්විණි. 10, 11 සහ 12 ශ්‍රේණිවල සිසුන් 300කට අධික පිරිසක් සහභාගී වූ අතර විද්‍යාත්මක මාර්ගෝපදේශන තුළින් උසස් අධ්‍යාපනය, විද්‍යාත්මක ප්‍රවේශය හා අනාගතයේ විද්‍යාත්මක අවස්ථා පිළිබඳ කැපවීම ලබා ගන්නා ලදී.

1. Career Guidance Programme – Next Gen Devans

A Career Guidance Programme titled "Next Gen Devans" was successfully conducted on 23rd January 2026 at the Maliyadeva College Main Auditorium with the support of the 2003 Group. Approximately 300 students from Grades 10, 11 and 12 participated in the programme, which provided valuable guidance on higher education, vocational pathways and future career opportunities.









Lathe Machine ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රායෝගික මාර්ගෝපදේශන විධිවිධාන

උපදෙස් මෙහෙයුම් කාර්යක්ෂමතාවය නිවැරදිව සිදුකිරීම සඳහා Lathe Machine ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රායෝගික මාර්ගෝපදේශන විධිවිධාන 2026 ජනවාරි 30 දින කුරුණෑගල පිහිටි යන්ත්‍ර වැඩමුළුවකදී පැවැත්වුණි. මෙමගින් තාක්ෂණ ශාඛාවේ සිසුන්ට යන්ත්‍ර ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම සිදුකරන ලදී. මෙම විධිවිධාන මගින් සිදුකළ Lathe Machine ක්‍රියාකාරිත්වය පිළිබඳව සිසුන්ගේ ප්‍රායෝගික දැනුම තවදුරටත් වර්ධනය කිරීම සිදුකරන ලදී.

2. Practical Guidance Programme on Lathe Machines

A Practical Guidance Programme on Lathe Machines was organized on 30th January 2026 for Technology stream students at a machine workshop in Kurunegala with the assistance of Mr. Palliyaguru. The programme offered students hands-on exposure to lathe machine operations and enhanced their practical understanding of machining processes and industrial applications.





Upcoming Projects

පසුගිය වසර තුළ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, 'දිට්වා' ඇතුළු විවිධ අනපේක්ෂිත හේතුවන් මත ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එබැවින්, මෙම ව්‍යාපෘති අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

The following projects were planned for implementation; however, they could not be conducted due to various unforeseen circumstances, including the Ditwa tragedy. These projects have been earmarked for implementation in the near future.

3. Workshop for Commerce Section Students

1995 කණ්ඩායමේ අනුග්‍රහය ඇතිව, වර්තමාන ගණකාධිකාරී සංගමයේ සභාපති ටිශාන් සුබසිංහ මහතා විසින් අ.පො.ස. උසස් පෙළ වාණිජ අංශයේ සිසුන්ට සඳහා අධ්‍යාපනික දැනුමක් ලබාදීමට පැවැත්වීමට යෝජනා කර ඇත

It is proposed to conduct an educational session for the G.C.E. Advanced Level Commerce stream students by Mr. Tishan Subasinghe, Chairman of the Chartered Accountants Association, with the programme being facilitated through the support of the 1995 Group.

4. AI and IT Workshops

ESOFT ආයතනය සමඟ සහයෝගයෙන් තාක්ෂණික (IT) සිසුන් සඳහා අධ්‍යාපනික වැඩසටහනක් පැවැත්වීමට යෝජනා කර ඇත. මෙම වැඩසටහන කෘතිම බුද්ධිය (AI) සහ තාක්ෂණික ක්ෂේත්‍රවල නවතම වර්ධන හා ඉදිරිගමන් මත ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන අතර, සහභාගිකයින්ට වත්මන නවෝත්පාදන හා අනාගත වෘත්තීය අවස්ථා පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දීම අරමුණු කරයි.

It is proposed to conduct an educational session for Information Technology (IT) students in collaboration with ESOFT. The workshop will focus on the latest developments and emerging trends in the fields of Artificial Intelligence (AI) and Information Technology, providing participants with valuable insights into current innovations and future career opportunities.

අනුකාරක සභා වාර්තා

සමාජයීය අනුකාරක සභාව



ගරු උප සභාපති
ඩී.එම්.ටී. මදුසංක දිසානායක



ගරු ලේකම්
ඩී.එම්.එල්. නෙරංජන් කුලරත්න

2025/2026 වර්ෂය සඳහා මලියදේව ආදී ශිෂ්‍ය සංගමයේ සාමාජීය අනුකමිටුවේ සභාපතිවරයා ලෙස D.M. තිලින මධුසංඛ දිසානායක මහතා පත් වූ අතර ලේකම්වරයා ලෙස D.M.L. නෙරන්ජන් කුලරත්න මහතා පත් කරගන්නා ලදී.

සාමාජීය අනුකමිටුවේ පළමු ව්‍යාපෘතිය ලෙස සාම්ප්‍රදායට අනුකූලව සෑම වසරකම දෙවන කමිටු රැස්වීම චාරිකාවක් ලෙස සංවිධානය කරනු ලබයි. මෙය අප සංගමයේ සියලුම සාමාජිකයන්ගේ සහයෝගිතාවය වර්ධනය කරගැනීම සඳහා අවස්ථාවක් කරගන්න අතර මෙවරද එම චාරිකාව 2025 නොවැම්බර් මස 29 සහ 30 යන දෙදින Half Board පැකේජයක් ලෙස වෙන්නප්පුව Kumudu Valley Resort හෝටලයේ පැවැත්වීමට තීරණය කෙරුනි. එහෙත් අවාසනාවන්ත ලෙස එම දිනවල රට තුලට බලපෑ දිවා සුළි කුණාටුව සහ අයහපත් කාලගුණය හේතුවෙන් මෙම චාරිකාව 2026 පෙබරවාරි මස 21 සහ 22 දක්වා කල් දැමීමට සිදු විය. ඉන් පසුව පෙබරවාරි මස /21/22/ දෙදින මෙම චාරිකාව Kumudu Valley Resort හෝටලයේ අති සාර්ථකව පැවතියේ නවක සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් 60 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙනි. එහිදි විනෝදකාමී අත්දැකීම් රැසක් විඳගන්නට ලැබූ අතර චාරිකාව සියලු දෙනාගේම පැසසුමට ලක් විය.

මේ සඳහා වැය වූ සියලුම මුදල් චාරිකාව සඳහා සහභාගි වූ සාමාජිකයන්ගෙන් පියවාගත් අතර, තවද 88 කණ්ඩායමෙන් 15,000/- පමන වටිනා අනුග්‍රාහක දායකත්වයක් පානයන් සඳහා ලැබුණි. එයට ද විශේෂ ස්තූතියක් පුදකර සිටින්නෙමු.








සාමාජීය අනුකමිටුවේ දෙවන ව්‍යාපෘතිය ලෙස Devans Night 2026 සංවිධානය කෙරුනු අතර එම උත්සවය 2026 මාර්තු මස 28 දින සවස 7:00 කුරුණෑගල The Epitome Hotel හිදී පැවැතිණි. ඒ සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් විද්‍යාලයේ කීර්තිමත් ආදිශිෂ්‍ය Dr. Shamintha Amarathunga මහතා සහභාගි වූ අතර ගෞරවනීය අමුත්තා ලෙස තවත් විද්‍යාලයේ කීර්තිමත් ආදිශිෂ්‍යකු වන Country style foods Ltd ආයතනයේ Smak brand Products හී අලෙවි හා අලෙවිකරණ ප්‍රධානී Mr. Nilantha Dias මහතා සහභාගි විය. තවද මේ සඳහා මලියදේවයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයන් රැසක් ආරාධිතයින් ලෙස සහභාගි වූහ.

Devans Night 2026 උත්සවයද අති උත්කර්ෂවත් අන්දමින් ආදි සහ නවක මලියදේවයන්ගේ 250 පමන සහභාගීත්වයෙන් පැවති අතර නැටුම්, ගැයුම්, වැයුම් සහ Raffle Draw හී ගුවන් ටිකට්පත් ඇතුලු විශේෂ තැගි රැසකින් සමන්විත විය.

උත්සවය සඳහා 3,250,000.00 පමන මුදලක් වය වූ අතර ටිකට්පත් මගින් ලැබූ අදායම සහ අනුග්‍රහකයන්ගේ දායකත්වයෙන් මෙම වියදම පියවා ඉතිරිය ආදි ශිෂ්‍ය සංගමයේ ගිණුමට බැර කරන ලදී. මේ සඳහා Door Gift ලෙස Shello සහ CBL ආයතනයන්ගෙන් 600,000.00 පමන වටිනා තෑගි පර්සල් ලබා දුන් අතර 1,250,000.00 Raffle Draw Matrixx, Epitome, Brilliance Auto Life, Nawaloka Opticals සහ The Traveller Global Pvt Ltd යන ආයතන දායකත්වය දක්වන ලදී. එසේම Ticket මුද්‍රණය සඳහා Coolway ආයතනයද, 88 කණ්ඩායමෙන් 36,000.00 පමණ වටිනාකමකින් යුත් පානයන් ලබාදෙන ලදි.










අනුකාරක සභා වාර්තා







සාමාජීය අනුකමිටුවේ අවසාන ව්‍යාපෘතිය වන Devans Dinner 2026, සැප්තැම්බර් මස 19 දින සම්ප්‍රදායානුකූලව පාසලේ ප්‍රධාන ශාලාවේ පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.



අවසාන වශයෙන් සාමාජීය අනුකමිටුව තුළ වෙහෙස මහන්සි වී කැපවීමෙන් ශ්‍රමයෙන් මෙන්ම මුදලින් අනුග්‍රහකත්ව ලබා දෙමින් හැකි අයුරින් උදවු උපකාර කල සියලුම දෙනාටත් නිලධාරී මණ්ඩලයේ සියලුම දෙනාටද, සාමාජීය අනුකමිටුවේ සියලුම ව්‍යාපෘති සහ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට නන්අයුරින් උපකාර කල සියලුම දෙනාට ස්තූතිය පුදකර සිටිමු.

අනුකාරක සභා වාර්තා

සුබසාධක අනුකාරක සභාව



ගරු උප සභාපති
දුලංජන අතපත්තු



ගරු ලේකම්
අජන්ත බණ්ඩාර

- 2025 - 2026 වර්ෂය සඳහා වූ පළමු කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම ආරම්භක දිනයේ සම්ප්‍රදායක ලෙස ආගමික කටයුතු සංවිධානය කිරීම.





- 2026 නව අවුරුදු උදාව වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලයේ උත්සවය සංවිධානය කිරීම.






- දිට්වා සුළි කුණාටුව මගින් අපදාවට පත් වූ සහෝදර ජනතාව වෙත ''සහන යාත්‍රා'' ක්‍රියාත්මක කිරීම.











අනුකාරක සහා වාර්තා

- ආදි ශිෂ්‍ය කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා බක්මහ උළෙල - 2026 සංවිධානය කිරීම.










- මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ වර්ෂය පුරා සිදුකරනු ලබන විශේෂ අවස්ථාවන් සඳහා අවශ්‍ය සුබපැතුම් ප්‍රදර්ශන පුවරු සුබසාධක අනුකාරක සභාව හරහා සිදුකිරීම. එමෙන්ම විද්‍යාලයට සහ ආදිශිෂ්‍ය සංගමයට අදාළ ශෝකානුකූල බැනර් ප්‍රදර්ශණය අනුකාරක සභා නියෝජිතයන් හරහා සිදුකිරීම මඟින් ආදි ශිෂ්‍ය සංගමය වෙත ශක්තිය ලබාදීම.






අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

සුබසාධක සංගමය



ගරු සභාපති
දුලංජන අතපත්තු



ගරු ලේකම්
මාපා රත්මලේ



ගරු භාණ්ඩාගාරික
ජානක පතිරාජ

- 1991 - 2026 වර්ෂයේ ආරම්භ කරන ලද සුබසාධක සංගමය සාමාජිකයන් 1500 කට වැඩි පිරිසක් සාමාජිකත්වයකට උරුමකම් කියමින් 35 වන සංවත්සරය සමරයි.

මලියදේව විද්‍යාලයේ උන්නතිය සඳහා සිදුකල ව්‍යාපෘති

- නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා හිස්වැසුම් පරිත්‍යාගය සහ අනෙකුත් සහයෝගයන් ලබාදීම.
- විද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා අවශ්‍ය කබඩ් අළුත්වැඩියා කිරීම සඳහා අනුග්‍රහය දැක්වීම.
- මහා ක්‍රිකට් තරඟයේ දී ටිකට් අලෙවියෙන් සහ ඇතුල්වීමේ ගේට්ටුවේ ආවරණ දායකත්වය ලබාදීම.






- ආදි ශිෂ්‍ය කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා බක්මහ උළෙල - 2026 සංවිධානය කිරීම.










අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

- මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ වර්ෂය පුරා සිදුකරනු ලබන විශේෂ අවස්ථාවන් සඳහා අවශ්‍ය සුබපැතුම් ප්‍රදර්ශන පුවරු සුබසාධක අනුකාරක සභාව හරහා සිදුකිරීම. එමෙන්ම විද්‍යාලයට සහ ආදිශිෂ්‍ය සංගමයට අදාළ ශෝකානුකූල බැනර් ප්‍රදර්ශණය අනුකාරක සහා නියෝජිතයන් හරහා සිදුකිරීම මගින් ආදි ශිෂ්‍ය සංගමය වෙත ශක්තිය ලබාදීම.






- සාමාජිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සමීපතමයන්ගේ රෝගී අවස්ථාවල දී මූල්‍ය ප්‍රධාන ලබාදීම හා එම පවුල් සමඟ එක්ව ඔවුන්ගේ සුවදුක් විමසා ඔවුන්ට අවශ්‍ය සහයෝගය ව්‍යවස්ථානුකූලව ලබා දීම.
- අප අතරින් වෙන් වූ සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සමීපතයන් වෙනුවෙන් මරණ පාරිතෝෂික ලබාදීම මෙන්ම දැන්වීම් ප්‍රදර්ශණය සහ එම අවස්ථාවලදී ශෝකය බෙදා ගැනීම.
- ආදි ශිෂ්‍යයන් සඳහා භාවිතා කළ හැකි කාර්යාල බෑගයක් සහ විද්‍යාලයේ දරුවන් සඳහා කැප් නිර්මාණය කර එම බෑගය අළෙවි කිරීමෙන් ලැබෙන ලාභය ආදි ශිෂ්‍ය සංගමයේ උන්නතියට ලබා දීම.



- ''දිට්වා'' සුළි කුණාටුව මගින් අපදාවට පත් වූ සහෝදර ජනතාව වෙත ''ආදි මලිදෙව් සහන යාත්‍රා'' ක්‍රියාත්මක කිරීම.










අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

- 2026 Devans Night සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම.
- ආදිශිෂ්‍ය සංගමයේ මාසික කමිටු රැස්වීම සඳහා කෙටි ආහාර සහ තේ පැන් සංග්‍රහට අනුග්‍රහකත්වය දැක්වීම.
- ඕල්කට් ක්‍රිකට් තරඟය සඳහා මූල්‍ය දායකත්වයක් ලබාදීම.
- පළමුවන කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේ පිරිත් සජ්ඣායනය සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම.
- සුබසාධක සංගමයේ වාර්ෂික සුහද හමුව පැවැත්වීම.











- සුබසාධක සංගමය පිළිබඳ වැඩි විස්තර සඳහා පහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන ලෙස ඉල්ලා සිටිමු.

අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

ආදි පැසිපන්දු සංගමය



ගරු සභාපති
ඉන්දික පෙරේරා



ගරු ලේකම්
සංජය දළුවත්ත



ගරු භාණ්ඩාගාරික
කේ.සී. බණ්ඩාර

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් අනුබද්ධිත කණ්ඩායම් සිදු කල ව්‍යාපෘති

- ප්‍රධාන පුහුණුකරු සහ සහාය පුහුණුකරු සඳහා මාසිකව රු. 35,000/- ක මුදලක් අඛණ්ඩව ලබා දීම.
- දරුවන්ගේ ක්‍රීඩා ඇඳුම් සඳහා අනුග්‍රහකත්වය දැක්වීම.
- පැසිපන්දු පුහුණුව සඳහා අවශ්‍ය පැසිපන්දු හා අනෙකුත් උපකරණ ලබාදීම.
- ක්‍රීඩා තරඟ සඳහා භෞතචිකිත්සක නිළධාරීන්ගේ සහාය ලබා දීම.
- දරුවන් සඳහා පෝෂණ වැඩසටහනක් ආරම්භ කර සෑම පුහුණු සැසියකින් පසුව පෝෂ්‍යදායී කෙටි ආහාර වේලක් ලබාදීම.
- මානසික සෞඛ්‍ය දියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පෝෂණ ඌණතා දරුවන් හඳුනාගෙන ඔවුන් සඳහා විටමින් හා ඖෂධ ලබා දීම.
- පැසිපන්දු පිටිය අළුත්වැඩියා කිරීම.
- ක්‍රීඩා තරඟ සඳහා මූල්‍යමය ආධාර ලබා දීම.











අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

ආදි ශිෂ්‍යභට සංගමය



ගරු සභාපති
සාලිය කරුණාරත්න



ගරු ලේකම්
ධනුෂ්ක මුතුනායක



ගරු භාණ්ඩාගාරික
දර්ශන අබේරත්න

අනු කණ්ඩායම විසින් සිදු කළ ව්‍යාපෘති සහ අනුග්‍රහයන්

01. 2025.11.08

2025 වර්ෂයේ හර්මන්ලෝස් ජාතික ශූරතාවය දිනාගත් මලියදේව විද්‍යාලයීය ශිෂ්‍යභට බණ්ඩය පිළිගැනීම සඳහා උත්සවයක් සංවිධානය කිරීම සහ එහිදී ඔවුන් ඇගයීම සඳහා කුසලාන, තෑග සහ රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වීම.

ආදි ශිෂ්‍යභටයින්ගේ සහභාගීත්වයෙන් පළමුවරට සුහදභමුවක් සංවිධානය කිරීම.









02. 2026.03.14

මලියදේව විද්‍යාලයීය ශිෂ්‍යභට බණ්ඩයේ ඉදිරි ප්‍රගමනය වෙනුවෙන් මුදල් එක්රැස් කිරීමේ අරමුණින් Safety Motor Rally තරඟාවලිය සංවිධානය කිරීම සහ එය සාර්ථකව අවසන් කිරීම.











අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

03.2026 වසරේ පවත්වන ලද නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේදී ශිෂ්‍යභට බණ්ඩය විසින් සිදු කරන ලද සරඹ සංදර්ශනය සඳහා අවශ්‍යතා මිලදී ගැනීමට රු.25,000.00ක මූල්‍යමය අනුග්‍රහය ලබාදීම සහ ආචාර පෙළපාලි කණ්ඩායම් සඳහා පිරිනැමෙන කේක් ත්‍යාගයන් සඳහා රු.20,000.00ක පමණ මූල්‍යමය අනුග්‍රාහකත්වය ලබාදීම.









04. 2026.05.27

විද්‍යාලයීය ශිෂ්‍යභට බණ්ඩයෙහි පුහුණුවීම් සඳහා අත්‍යවශ්‍යව පැවැති T-56 ගිණි අවි ආකෘති ලීයෙන් සකසා ඒවා ඔවුන්ගේ පුහුණුවීම් සඳහා ලබාදීම.(වැය වූ මුදල රු.75,000.00ක් වේ)







05. 2026.06.11

2026 වසරේ බළ ඇණි ඇගයීම් කඳවුර සඳහා සහභාගි වී ප්‍රථම ස්ථානය දිනාගත් මලියදේව ශිෂ්‍යභට බණ්ඩය පිළිගැනීමේ උත්සවයක් සංවිධානය කිරීම සහ ඔවුනට තේ පැන් සංග්‍රහයක් පැවැත්වීම.







අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

ආදී පාපන්දු සංගමය



ගරු සභාපති
රසික මානවඩු



ගරු ලේකම්
ඩුලිප් වීරතුංග



ගරු භාණ්ඩාගාරික
ඉෂාර අබේසිංහ

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් අනුබද්ධිත කණ්ඩායම් සිදු කල ව්‍යාපෘති

- ආදී මලියදේව පාපන්දු සංගමය බිහිකිරීම සඳහා 2017 වර්ෂයේදී මූලික අඩිතාලමක් දැමූ අතර ඉන් පසු එහි ක්‍රියාකාරිත්වය අතරමඟ ඇනහිට තිබුණි .
- 2025.10.26 වෙනි දින නව නිලධාරී මණ්ඩලයක් වාර්ෂික මහ සභාවකින් තෝරාපත් කරගෙන මලියදේව විද්‍යාලයෙන් බිහි වූ සියලුම ආදී ශිෂ්‍යයන්ගේ ඒකරාශී වීම තුළින් විද්‍යාලයේ පාපන්දු ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා සහයෝගය දැක්වීම අප සංගමයේ ආරම්භක මෙවන් අවස්ථාවක මූලික අරමුණක් ලෙස අපේ සියලු දෙනාගේ අධිෂ්ඨානය වී තිබේ.
- 2014 අනුකණ්ඩායමේ ආර්.ඩී.එම්.බී රාජකරුණා මහතා සහ රසික මානවඩු මහතාගේ මූල්‍ය පරිත්‍යාගයෙන් විද්‍යාලයේ පාපන්දු කණ්ඩායම් සඳහා බෝල දහයක් ලබා දෙන ලදී.
- 2026.03.15 දින මලියදේව විද්‍යාලයෙන් බිහිවූ සියලුම අනුකණ්ඩායම් ඒකරාශී කොට ගෙන වයස 35 න් පහළ , 35 න් ඉහළ අනුකණ්ඩායම්වල සත් සාමාජික තරගාවලියක් ඉතා සාර්ථකව පැවැති අතර ඊට 1994 ,1995 , 1996 ,1997 , 1998 , 1999 , 2002 , 2009 , 2013 ,2014 , 2017 , 2021 , 2025 යන අනුකණ්ඩායම්වල සාමාජිකයන් තරග වැදී තිබුණි.
- 35 න් පහළ ශූරතාවය - 2013 අනුකණ්ඩායම , 35 න් පහළ අනුශූරතාවය - 2017 අනුකණ්ඩායම , 35 න් ඉහළ ශූරතාවය - 1995 අනුකණ්ඩායම , 35 න් ඉහළ අනුශූරතාවය - 2002 අනුකණ්ඩායම , යන අනුකණ්ඩායම් විසින් දිනාගන්නා ලදී.
- තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා ආදී ශිෂ්‍ය සහ ආදී ශිෂ්‍ය නොවන අනුග්‍රාහකයන් 422000 මුදලක් ලබාදීමට කටයුතු කර ඇත.
- තරගාවලිය ආරම්භයේදී සියලුම ආදී ශිෂ්‍යයන් සඳහා වර්ණවත් ටී ෂර්ට් එකක් එළිදැක්වීම සිදු කරන ලදී.
- 2026 විද්‍යාලීය ක්‍රීඩා උත්සවය සඳහා කේක් ත්‍යාගයක් ලබා දෙන ලදී .
- මලියදේව විද්‍යාලයේ පාපන්දු ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් අරමුදලක් ඒකරාශී කිරීම උදෙසා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සාකච්ඡාවක් මේ වන විට ආරම්භ කොට ඇත.
- මලියදේව විද්‍යාලයෙන් බිහිවූ සියලුම ආදී ශිෂ්‍ය පාපන්දු ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් ''OLD DEVANS FOOTBALL NIGHT" එකක් 2026 දෙසැම්බර් මාසය තුළදී සිදුකිරීමට සාකච්ඡා කරමින් පවතී .
- 2026.04.09 දින මලියදේව විද්‍යාලයේ ගරු විදුහල්පති W.M.C.K. මහමිතව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩා නියෝජ්‍ය විදුහල්පතිතුමා , ක්‍රීඩාභාර ආචාර්යවරුන් , පුහුණුකරුවන් ,ක්‍රීඩා උපසභාපතිතුමා සහ ආදී මලියදේව පාපන්දු සංගමයේ සියලුම විධායක නිලධාරීන් සහ කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් 2027 වර්ෂයේදී මලියදේව විද්‍යාලයේ පාපන්දු ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් ගත යුතු තීරණ රැසක් සාකච්ඡාවට ලක් කෙරුණි.

අනුබද්ධිත කණ්ඩායම් වල වාර්තා

- මලියදේව විද්‍යාලයේ වයස 19 න් පහළ ක්‍රීඩා කණ්ඩායම සහ මලියදේව විද්‍යාලයේ පාපන්දු ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා අඛණ්ඩව වසර 24 කාලයක් තුළ කිසිදු වැටුපක් නොගෙන මලියදේව විද්‍යාලයේ දරුවන් උදෙසා තම කාලය, ශ්‍රමය, මුදල් කැපකර පූර්ව ප්‍රනාන්දු මහතාගේ කැපවීම ආදී මලියදේව පාපන්දු සංගමයේ සියලුම සාමාජිකයන්ගේ විශේෂ ඇගයීමට මේ වන විට ලක්ව තිබේ.
- ආදී මලියදේව පාපන්දු සංගමය ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ උපදෙස් ලබා දුන් මලියදේව විද්‍යාලීය ආදී ශිෂ්‍ය සංගමයේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ සියලු නිලධාරී මණ්ඩලයට සංගමයේ ගෞරවය මෙයින් පුද කර සිටිමි.
- අවසාන වශයෙන් 2025 / 2026 වර්ෂය පුරාවට ආදී මලියදේව පාපන්දු සංගමය ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට තම දායකත්වය ලබා දුන් ගරු සභාපති රසික මානවඩු මහතා ප්‍රමුඛ සියලුම විධායක සාමාජිකයන්, සියලුම කමිටු සාමාජිකයන්ට ආදී මලියදේව පාපන්දු සංගමයේ ගෞරවය මෙයින් පුදකර සිටිමි.





















75 ට පෙර කණ්ඩායම



සභාපති
මහින්ද මැදගොඩ



ලේකම්
රෝහණ ශ්‍රී පුෂ්පලාල්



භාණ්ඩාගාරික
රෝහිත සමරකෝන්

මලියදෙව ආදි ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨතම කණ්ඩායම වන 75 පෙර කණ්ඩායම 2026 වන විට 31 වසරක් සපුරා ඇත. අපගේ 31 වසර පුරාවට විද්‍යාලයේ ද, ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින්ගේ ද සුභසාධනය වෙනුවෙන් විශාල මෙහෙවරක් සිදු කර ඇත. එමෙන්ම මේ වන විට 75 පෙර පමණක් නොව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආදි සිසුන්ට ද, අප වෙත බැඳී අතීත රසවත් මතකයක් අවධි කිරීමට අප අවස්ථාව සලසා දී ඇත. එබැවින් ද අපගේ කණ්ඩායම සහ සුභ සාධක කණ්ඩායමට බැඳී ඔබගේ සාමාජීය කටයුතු සාර්ථක කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලමු.

අනුකණ්ඩායම විසින් සිදුකල සමාජ සත්කාරක ව්‍යාපෘති

විද්‍යාලය වෙනුවෙන්

- මව් සංගමයේ බොහෝ අනුශාසකවරුන් අප කණ්ඩායමේ සාමාජිකයින් වන නිසා විද්‍යාලයට සහ ආදි ශිෂ්‍ය මව් සංගමයට අවශ්‍ය සෑම විටකදීම මග පෙන්වීම අවශ්‍ය අනුශාසනා ලබා දී දුෂ්කරතා ඇති වූ සෑම අවස්ථාවකදීම මූලිකත්වය ලබා දීම වැනි කටයුතු අප කණ්ඩායම විසින් නොපැකිලිවම ඉටු කර දී ඇත.

සමාජ සත්කාරක කටයුතු

- අපගේ වාර්ෂික වැඩ සටහනක් වූ ඉතා දුෂ්කර ගම්මානයක දරුවන් වෙනුවෙන් කරන පොත් සහ පොත් බෑග්, සපත්තු ආදිය සහ ගුරුවරුන් සහ පාසැල වෙනුවෙන් වෙනත් උපකරණ ද පුස්තකාල පොත් බෙදා දීම මෙවර මහව කලාපයේ ගිරිබාව කොට්ඨාශයේ ගම්පොල කනිටු විදුහලේ ඉගෙනුම ලබන ළමුන් 100 වැනි පිරිසකට රු. ලක්ෂ 04 පමණ වටිනා උපකරණ ඉහත සඳහන් අයුරින් බෙදා දෙන ලදී. මීට සමගාමීව රුක් රෝපණ වැඩ සටහනක් ද අපගේ සංවිධානයෙන් දෙමාපිය දූ දරුවන් හා එක්ව සිදු කරන ලදී. මෙහිදී තරුණ බෞද්ධ සමිතියේ ගරු සභාපති එන්. එස්. කේ. විජේනායක මහතා මලියදේව ළමා නිවාසය හරහා ලබා දුන් දායකත්වය අගේ කොට සලකමු.

ආගමික වැඩ සටහන්

- අප කණ්ඩායමේ මියගිය හා දැනට අසනීප තත්ත්වයෙන් පසුවන සාමාජිකයින්ගේ සුගතිය සහ අසනීප තත්ත්වයෙන් මිදීමට බෝධි පූජාමය පිංකමක් කුරුණෑගල මිල්ලව විහාරස්ථානයේ පවත්වන ලදී. මේ සියලු කටයුතු සඳහා කර්නල් පී. සී. රත්නමලල මහතාගේ මැදිහත් වීම අගය කොට සලකමු.

ශිෂ්‍යාධාර අරමුදල

- අප අතරින් වියෝ වූ අපගේ සම්මානනිය අනුශාසක වරයකු හා බොහෝ කාලයක් භාණ්ඩාගාරික තනතුර ඉසිලූ ජේ. බී. ඇහැලේපොල මහතාගේ නමින් චන්ද්‍රා ජයසේකර මහතාගේ මූලික ධන පරිත්‍යාගයෙන් ඇහැලේපොළ ශිෂ්‍යාධාර අරමුදල නමින් ගිණුමක් විවෘත කොට දුෂ්කර පලාත්වල තෝරා ගත් ශිෂ්‍යයන් වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වලට ආධාර කිරීම සක්‍රීයව සිදුවේ. වර්තමානයේ බොහෝ සාමාජිකයින් පිරිසක් එයට දායක වීම හරහා එය වර්ධනය කිරීමට හැකිවීම අපගේ සතුටට කාරණයකි.

අනුකණ්ඩායම් වාර්තා

සුභ සාධක කටයුතු

- 75 පෙර කණ්ඩායම මඟින් දැනට ක්‍රියාත්මක සුභ සාධක සේවාව හරහා අසනීප තත්ත්වයෙන් පසුවන සාමාජිකයින් ගැන සොයා බලා ඔවුන්ට අවශ්‍ය මූල්‍යමය හෝ අනෙකුත් ද්‍රව්‍ය සැපයීම, මියගිය අයවලුන් වෙනුවෙන් පුණ්‍ය කටයුතු සිදු කිරීම ද සිදුවේ. මෙහිදී අප භාණ්ඩාගාරික රෝහිත සමරකෝන් මහතාගේ දායකත්වය අප විසින් ඉතා අගය කොට සලකමු.

විශේෂ දිවා භෝජන සංග්‍රහය

- අප කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන දැනට එක්සත් ජනපදයේ වෛද්‍ය වෘත්තියේ නියුතු කාශ්‍යප දිසානායක සොයුරා විසින් අප සාමාජිකයින් වෙනුවෙන් පවත්වන සුහද සාදය මෙවර මීගමු පාර්ක් කාමල් හෝටලයේදී ඉතාමත් ඉහලින් පවත්වන ලදී. එම සොයුරා විදෙස් ගත වී පුරා අවු 40 ගෙවීමද මෙහි තිබූ විශේෂත්වයකි. ඔහු විසින් 75ට පෙර කණ්ඩායම වෙනුවෙන් දක්වන මූල්‍යමය දායකත්වයද මෙහිදී අගය කරන ලදී. මෙම කටයුතු සාර්ථක කිරීම සඳහා ඒ. බී. ඒකනායක සොයුරාගේ මැදිහත්වීම අගයමු.

සම්මාන ප්‍රදානය සහ සේවය ඇගයීම.

- අපගේ සම්මානනීය අනුශාසකවරයකු වන ජ්‍යෙෂ්ඨ නීතිඥ ජී. බී. සේනානායක මැතිතුමාගේ වෘත්තීය ජීවිතයට අවු. 50 ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් හා ඔහු විසින් 75 ට පෙර කණ්ඩායමට කලා වූ සේවය සහ දායකත්වය වෙනුවෙන් සමරු තිළිණයක් පිරිනැමීම 2026 වර්ෂයේ අප කලාවූ විශේෂ කටයුත්තකි.

2025 /26 වර්ෂයේ අප අතරින් වියෝ වූ සාමාජිකයින් - ටී. බී. තෙන්නකෝන් මහතා

- තවද අපගේ සාමාජිකයින් කණ්ඩායම් පහකට බෙදා මාස 3 - 4 කට වරක් එක් කණ්ඩායමක අනුග්‍රහයෙන් සුහද හමුවක් පවත්වා එදින අපගේ සභා රැස්වීමද පවත්වන අතර අවසානයේ රැස්වීමට පැමිණි සියලු දෙනාටම භෝජන සංග්‍රහයක් පැවැත්වීම ද සිදුවේ. මේ සඳහා අපගේ ආදි ශිෂ්‍ය දැනට රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ උසස් නිලතල දරණ ප්‍රභූන් කිහිප දෙනෙකුට ආරාධනා කිරීම ද විශේෂයකි. අප කණ්ඩායම වෙනුවෙන් අපගේ නියෝජිත ආනන්ද පතිරණ මහතා දක්වන සේවයද අගයමු.

අනුකණ්ඩායම විසින් ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ඡායාරූප









අනුකණ්ඩායම් වාර්තා

88 කණ්ඩායම



සභාපති
වෛද්‍ය තිසර පෙරේරා



සමලේකම්
කැලුම් මීදෙණිය



සමලේකම්
චාමින්ද දිසානායක



භාණ්ඩාගාරික
දර්ශන තෙන්නකෝන්

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් 88 අනුකණ්ඩායම සිදු කල ව්‍යාපෘති

- අප සාමාජික මේජර් ජනරාල් රෝහිත අලුවිහාරේ සොයුරා, 2025 වසරේ කදවුරු ගතවීමට පෙර ශිෂ්‍ය භට කණ්ඩායම වෙත පුහුණු සැසියක් පැවැත්වීම.
- එමෙන්ම මේජර් ජනරාල් රෝහිත අලුවිහාරේ සොයුරාගේ ප්‍රධානත්වයෙන් දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රමික සහ ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ ආදිශිෂ්‍ය සාමාජිකයින් මගින් රුපියල් ලක්ෂ 300,000/- ක පමණ පරිත්‍යාගයක් සිදුකිරීම.
- චන්දන අලහකෝන් සොයුරා පෙර වසර වලදී පරිදිම රු ලක්ෂ 300,000/- ක් රගර් ක්‍රීඩාව සඳහා පරිත්‍යාග කිරීම.
- 88 සාමාජික සනත් කරුණාරත්න සොයුරාගේ රුපියල් 120,000/- ක ධන පරිත්‍යාගයෙන් සහ 88 සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් විද්‍යාලයීය ක්‍රීඩා පිටියේ ක්‍රීඩාගාරයේ තාවකාලිකව රඳවා තිබූ ජල ටැංකිය නැවත පිටිය කෙළවරේ ස්ථානගත කිරීම.
- 88 සාමාජික චන්දන අලහකෝන් සොයුරාගේ රුපියල් 100,000/- ක් වූ පූර්ණ අනුග්‍රහයෙන් වාර්ෂික එක්දින තරගය දින වෙලගෙදර ක්‍රීඩාංගණයේ පැරණි ක්‍රීඩාගාරයේ ඉහල මහලය ලබාගෙන මලියදේව,ශාන්ත ආනා,මලියදේව බාලිකා සහ ශුද්ධ වූ පවුලේ බාලිකා යන පාසල්වල 88 කණ්ඩායම් සාමාජික සාමාජිකාවන්ගේ සාමූහික නැරඹුම් මැදිරිය ලෙස භාවිතා කිරීම.
- විශේෂඥ වෛද්‍ය උපුල් මඩහපොල සොයුරා විසින් 2008 කණ්ඩායම සංවිධානය කල විශ්‍රාමික ගුරුවරුන් සඳහා වූ වෛද්‍ය කදවුරේ ප්‍රධාන සම්පත් දායක ලෙස සම්බන්ධ වීම.
- 88 සාමාජික ප්‍රසන්න බෝගමුව සොයුරා,ආදි තූර්ය වාදක ශිෂ්‍ය භට සංගමය වෙත රු.ලක්ෂයක් මුදලක් පරිත්‍යාග කිරීම.
- 88 සාමාජික චන්දන අලහකෝන් සොයුරා ආදි ශිෂ්‍ය භට කණ්ඩය වෙත රුපියල් 25,000/- ක් පරිත්‍යාග කිරීම.
- විශේෂඥ වෛද්‍ය උපුල් මඩහපොල සොයුරා විද්‍යාලයීය වාර්ෂික ක්‍රීඩා උත්සවයේදී විශේෂ ආරාධිත අමුත්තා ලෙස සහභාගි වීම.


මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් 88 අනුකණ්ඩායම සිදු කල ව්‍යාපෘති

- ආදි ශිෂ්‍ය සුභසාධක අනුකාරක සභාව විසින් වාර්ෂිකව සංවිධානය කරන සිංහල අවුරුදු උත්සවය සඳහා රු 75,000/- වටිනා ත්‍යාග අයිතමයන් ලබාදීම.
- වාර්ෂික Devans Night සඳහා සාමාජිකයින් 15 දෙනෙකු සහභාගි වීම.
- ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන අරමුදල් සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය වූ Quadrafest සඳහා ප්‍රවේශපත්‍ර 21 ක් මිලදී ගැනීම.

අනුකණ්ඩායම් වාර්තා

- ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කරන වාර්ෂික අන්තර් අනු කණ්ඩායම් ක්‍රිකට් තරගාවලිය සඳහා ජ්‍යෙෂ්ඨතම කණ්ඩායමක් ලෙස සහභාගි වීම.

අනුකණ්ඩායම විසින් ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ඡායාරූප










89 කණ්ඩායම



සභාපති
චන්දිම අධිකාරි

සම ලේකම්
රංජිත් බණ්ඩාර

සම ලේකම්
එන්.බී. රත්නායක

භාණ්ඩාගාරික
මංජුල දසනායක

මලියදේව විද්‍යාලයේ 89 අනුකණ්ඩායම් සිදු කල ව්‍යාපෘති

- සාමාජික පවුල් වල දරු දැරියන්ගේ කුසලතා එළි දැක්වූ දරු තරු ප්‍රසංගය.
- විද්‍යාලීය රතු කුරුස සංගමයේ කාර්යාලය තීන්ත ආලේපකර, නව සිවිලිමක් ගසා අලුත්වැඩියාකර දීම.
- ඇත්කඳ රාජ මහා විහාරස්ථානයේදී පැවති "මහ රහතුන් වැඩි මඟ ඔස්සේ" ශීල සමාධාන වැඩසටහන සංවිධානය කර පාසැලේ සහ ආදි ශිෂ්‍ය මව් සංගමයේ මූලිකත්වයෙන් පැවැත්වීම.
- පාසැලේ පැවති ධාතු වන්දනා වැඩසටහනට උපරිම දායකත්වය ලබා දීම.
- ආදි ශිෂ්‍ය මව් සංගමය විසින් සංවිධානය කළ දේවන්ස් නයිට්, ඇනුවල් ඩිනර් සහ සවුන්ඩ් ෆස්ට් වැඩසටහන් සඳහා අප කණ්ඩායමේ වැඩි පිරිසක් සහභාගී කරවීමට කටයුතු කිරීම.

93 කණ්ඩායම



President
W.D.P.I. Wickramasinghe



Secretary
S.L.D.R. Bandara



Treasurer
S.M.W.P. Siriwardhana

Projects undertaken for the advancement of Maliyadeva College

Two scholarships were presented to the school by '93 group for the advancement of Maliyadeva College.

- An amount of Rs.25,000 is awarded to the most outstanding all-round sportsman within the respective year.
- An amount of Rs.25,000 is awarded to the highest performing student within the respective years.

Projects undertaken for the betterment of the OBA

There were 2 projects undertaken for the betterment of the OBA. Namely,

- Almsgiving activity conducted for a children's home on 25th October 2025
- Annual Get-together conducted on 11th January 2026



අනුකණ්ඩායම් වාර්තා

94 කණ්ඩායම



සභාපති
මාධව කඩුපිටිආරච්චි



ලේකම්
අසංක ගුණසිංහ



භාණ්ඩාගාරික
එච්.එස්. රන්දික හේරත්

පසුගිය වසර තුළ "94-අපි" අනුකණ්ඩායම් සිදු කල ව්‍යාපෘති

- 2025 සහ 2026 එක් දින ක්‍රිකට් තරගය කණ්ඩායමක් ලෙස නැරඹීමට එක්වීම
- උත්තම ධාතු වන්දනාවේ සංග්‍රහ සඳහා සහය ලබාදීම
- අප පවුල්වල සාමාජිකයින් සමග අවුරුදු අසිරිය විඳගැනීම
- 94 අපි ආදි රග්බි සහයෝගය විසින් සංවිධානය කළ කනිෂ්ඨ රග්බි තරගාවලිය
- පූර්නිමා සොහොයුරියගේ රෝගී අවස්ථාව සඳහා දායකත්වය ලබාදීම
- වසර 50 පිරීම නිමිත්තෙන් වාර්ෂික පිරිත් පින්කම පැවැත්වීම සහ පසුදින දානමය පුණ්‍යකර්මය පවත්වා අප අතරින් වියෝ වූ සොයුරන්ට පින් අනුමෝදන් කිරීම
- 50 වන උපන්දින සැමරුම් වාර්ෂික සුභද හමුව
- ආදි ශිෂ්‍ය සය සාමාජික ක්‍රිකට් තරගාවලිය සඳහා සහභාගිවීම
- අප සොහොයුරකුගේ සහ සාමාජික පවුල්හි පැවති අභාවයන් 03ක් වෙනුවෙන් මුල්‍ය සහයෝගය ලබාදීම
- 2026 වර්ෂයේ කනිෂ්ඨ රග්බි කණ්ඩායම් සඳහා (12 සහ 14 පහළ) ජර්සි ලබාදීම * පූර්ණ අනුග්‍රහය දුමාල් කන්නංගර සොයුරා.











95 කණ්ඩායම



සභාපති
සෙනරත් විජේසිංහ



ලේකම්
අමිල තෙන්නකෝන්



භාණ්ඩාගාරික
ඉන්දික දිසානායක

2025/2026 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම්

- අප 95 කණ්ඩායමේ සහෝදර සොයුරන් සිහිපත් කරමින් ඔවුන්ට පිං පැමිණාවීම වෙනුවෙන් වාර්ෂිකව සිදු කරනු ලබන ආගමික වැඩසටහන මෙවරත් ''අරියමග්ග'' විහාරස්ථානය මූලික කරගෙන පවත්වන්නට කටයුතු කරන ලදි.
- ආදි ශිෂ්‍ය මව් සංගමයේ අනු කණ්ඩායම් අතර එකමුතුකම හා සහෝදරත්වය ප්‍රවර්ධනය කරගනු වස් වාර්ෂිකව පවත්වනු ලබන ''සය සාමාජික'' ක්‍රිකට් සැනකෙලිය වෙනුවෙන් අප කණ්ඩායමක් ඉදිරිපත් කරන ලදි.
- ආදි ශිෂ්‍ය මව් සංගමයේ අරමුදල් රැස්කර ගැනීම වෙනුවෙන් පැවැත්වූ QuadraFest සංගීතමය ප්‍රසංගය සඳහා අනු කණ්ඩායමක් ලෙස සිය දායකත්වය ලබාදෙන ලදි.
- 95 කණ්ඩායමේ Golden Fifty(1976-2026) සැමරුමට සමගාමීව 2026 වසරේ විද්‍යාලයීය වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ ප්‍රධාන අනුග්‍රාහකත්වය රවීන්ද්‍ර හේරත් ප්‍රමුඛ අප අනු කණ්ඩායම විසින් දරන ලදි.
- 2026 විද්‍යාලීය වාර්ෂික ක්‍රීඩා උත්සවයේ පාපැදි ඉසව්වේ ජයග්‍රාහකයන් සඳහා පිරිනැමෙන පාපැදි 3 අප 95 කණ්ඩායමේ රසික මානවඩු, චන්දික අමරසිංහ, හෙක්ස්ලි තෑලිස් යන සොයුරන් විසින් පරිත්‍යාග කරන ලදි.
- මලියදේව විද්‍යාලීය පාපන්දු ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් රසික මානවඩු සොයුරා විසින් ''පාපන්දු''පරිත්‍යාග කරන ලදි.
- වාර්ෂිකව පවත්වනු ලබන Devans Night සඳහා අනු කණ්ඩායමක් ලෙස සිය දායකත්වය ලබා දෙන ලදි.
- 95 අපේ Golden Fifty සැමරුමට සමගාමීව මලියදේව ශාන්ත ආනා වාර්ෂික එක් දින තරගයේදී නව සංකල්පයක් හඳුන්වා දෙමින් ශාන්ත ආනා 95, මලියදේව බාලිකා 95, ශුද්ධ වූ කන්‍යාරාමයේ 95 යන සහෝදර පාසල්වල සොයුරු සොයුරියන්ගේ සහභාගිත්වයෙන් Red Carpet හි රු. 300,000/= ක ටිකට්පත් මිලදී ගනිමින් තරගය සඳහා නව පීවයක් එක් කරන ලදි.
- Golden Fifty සැමරුම වෙනුවෙන් 95 අපේ සොයුරන් හා පවුල්වල සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික අවුරුදු උත්සවය හා විනෝද චාරිකාවක් මැයි මස 23 හා 24 යන දෙදින තුළ කළුතර වස්කඩුව Hibiscus හෝටල් පරිශ්‍රය මූලික කරගෙන සංවිධානය කරන ලදි. ඒ සඳහා 110 ක පමණ පිරිසක් සහභාගී වූ අතර සුන්දර අත්දැකීමක් ඊට සහභාගී වූ සියලු දෙනා අත්විඳින ලදි. (අවුරුදු උත්සවය සහ පවුලේ විනෝද චාරිකාව 2026)
- මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය මව් සංගමය මගින් සිදු කරනු ලබන බොහෝ වැඩසටහන් සඳහා අප සොයුරන් ශ්‍රම දායකත්වය නිරතුරුව ලබා දේ.

අනුකණ්ඩායම් වාර්තා


දයාබර සොයුරනි... ඔබ අප හැර ගියත් ඔබේ මතකය සදාකාලිකයි....
චමින්ද විජේසුන්දර
ලසන්ත වන්නිආරච්චි
මංජුල හේරත්
සුමේධ ගාල්ලගේ
දර්ශන බෝයගනේ
සුරංග ගුණරත්න
සිවලි ඉණසිංහ
චමින්ද හායසරත්න
හලින් සටුසිරිය
සංඛ රණතුංග
සමන්ත හේමචන්ද්‍ර
රොෂාන් සුමේද
සාලිය විජේසෝන්
කල්දේරා
ඩන්ස්ටන් චරිණතුලසූරිය
මලියදේව ආදී ශිෂ්‍ය 95 කණ්ඩායම




28 Mar 2026 10:20 pm









97 කණ්ඩායම



සභාපති
කාංචන හේරත්



ලේකම්
කෝසල වීරසිංහ



භාණ්ඩාගාරික
එන්.ටී.බී. හේරත්

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් අනුකණ්ඩායම සිදුකල ව්‍යාපෘතීන්

- සෑම වසරකම නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල සඳහා ලබාදෙන කේක් ත්‍යාගය මෙම වසරේද ලබා දීම.
- නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල සාර්ථක කර ගැනීම සඳහා අප කණ්ඩායම් සාමාජික නුවන් උඩවත්ත සොයුරා රු. 200,000.00 ක මූල්‍ය අනුග්‍රහයන් ලබාදීම.
- නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල සාර්ථක කර ගැනීම සඳහා අප කණ්ඩායමේ සොයුරන් විසින් ශ්‍රම දායකත්වය ලබාදීම.
- විද්‍යාලීය රගර් ක්‍රීඩාව නංවාලීම වෙනුවෙන් සෑම මසකම අප කණ්ඩායම් සාමාජිකයන් වන කාංචන හේරත්, නුවන් හේරත්, සමන්සිරි දිසානායක, ලසන්ත ධර්මසේකර යන සොයුරන් විසින් රු.25,000.00 මූල්‍ය අනුග්‍රහයක් ලබා දීම.
- සම්පත් රණවක අනුස්මරණ ශූරතා බාලදක්ෂ ජම්බෝරිය සඳහා අප කණ්ඩායමේ නුවන් උඩවත්ත සොයුරා රු. 25,000.00 මූල්‍ය අනුග්‍රහයන් ලබාදීම.
- නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ පාපැදි තරග සඳහා ශ්‍රී ලංකා පාපැදි සංගමයේ උප සභාපති පිත්මල් රත්නායක සහෝදරයා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- විද්‍යාලයීය පැසිපන්දු ක්‍රීඩාව නංවාලීම සඳහා අප අනු කණ්ඩායම් සාමාජික ශ්‍රී ලංකා පැසිපන්දු කණ්ඩායම් නිටපු නායක ජගත් කුලතුංග, නාලක කුලරත්න, අජිත් ප්‍රේමරත්න තිළිණ හංසකුමාර හා සමන්සිරි දිසානායක යන සොයුරන් මූල්‍ය දායකත්වයන් හා ද්‍රව්‍යමය ආධාර ලබා දීම.
- ශ්‍රී ලංකා නිටපු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩක Devans ක්‍රිකට් ක්‍රීඩා සමාජයේ සභාපති රංගන හේරත් සොයුරා විද්‍යාලීය ක්‍රිකට් පුහුණුකරුවන් සඳහා පුහුණු දීමනා ක්‍රිකට් උපකරණ ලබාදීම.

මලියදේව විද්‍යාලීය ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අනුකණ්ඩායම සිදු කළ ව්‍යාපෘතීන්

- Quardrafest 2026 ප්‍රසංගය සාර්ථක කර ගැනීම සඳහා රු.75,000.00 ටිකට් පත් අලෙවියෙන් දායකත්වය ලබා දීම සහ රු.200,000.00 පමන අනුග්‍රාහක සම්බන්ධීකරණ කටයුතු අප අනු කණ්ඩායම් කමිටු සාමාජික කපිල කුලසේකර සහෝදරයා විසින් සිදු කිරීම.
- ආදී ශිෂ්‍ය මව් සංගමය මගින් සංවිධානය කරන ලද Epitome Hotel හි පැවති Devans Night 2026 සුභද හමුව සාර්ථක කර ගැනීම සඳහා අප කණ්ඩායම් සාමාජික නුවන් උඩවත්ත සොයුරා විසින් රු.130,000.00 මූල්‍ය අනුග්‍රහයක් දැරීම.
- Devans Night 2026 සුභද හමුව සාර්ථක කර ගැනීම සඳහා අප කණ්ඩායමේ සාමාජික සොයුරන් විසින් ශ්‍රම දායකත්වය ලබා දුන් අතර ඒදින රාත්‍රියෙහි පැවති සුභද හමුවටද අප කණ්ඩායමේ සොයුරන් සහභාගි වීම.
- මලියදේව ශාන්ත ආනා වාර්ෂික ක්‍රිකට් තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා අප කණ්ඩායම් සාමාජික කපිල කුලසේකර මහතා රු.600,000.00 ව්‍යාපෘති අනුග්‍රහයක් ලබා දීම සඳහා සම්බන්ධීකරණ කටයුතු

කිරීම සහ අප කණ්ඩායම් සාමාජිකයින් ශ්‍රම දායකත්වයන් ලබා දීම.

- Olcott අනුස්මරණ ශූරතා ක්‍රිකට් තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා රු.50,000.00 පමන අනුග්‍රහක සම්බන්ධීකරණ කටයුතු කපිල කුලසේකර සහෝදරයා විසින් සිදු කිරීම.
- ආදී මලිදෙව් රග්බි තරගාවලිය හා සුහද හමුව සාර්ථක කර ගැනීම සඳහාත් විද්‍යාලීය රගර් ක්‍රීඩාව වෙනුවෙන් සිසිර ගුණසේකර සොයුරා විසින් රු.100,000.00, නුවන් උඩවත්ත සොයුරා රු.40,000.00, ලසන්ත ධර්මසේකර සොයුරා රු.25,000.00, එංගලන්ත පදිංචි සාමාජික සොයුරන් රු.110,000.00, ඕස්ට්‍රේලියා පදිංචි සාමාජික සොයුරන් රු.80,000.00 අනුග්‍රාහක දීමනාවන් සිදු කිරීම හා එම සුහද හමුවට කණ්ඩායම් සාමාජිකයන් සහභාගි වීම.
- ආදී මලිදෙව් ක්‍රිකට් තරගාවලිය (Devans Cricket Carnival) සාර්ථක කර ගැනීම සඳහා අප කණ්ඩායම විසින් රු.10,000.00 මූල්‍ය අනුග්‍රහයක් සිදු කිරීම හා අප කණ්ඩායම එයට සහභාගි වීම.
- දිට්වා සුළි කුණාටුවෙන් අසරණ වූ පවුල් සඳහා ආදී ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කරන ලද සහන යාත්‍රා ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.25,000.00 සහල් සහ රු.10,000.00 බිස්කට් ලබා දීම.

අනුකණ්ඩායම මගින් සිදුකල වෙනත් වැදගත් ව්‍යාපෘතීන්

- දිට්වා සුළි කුණාටුවෙන් අසරණ වූ පවුල් සඳහා අප කණ්ඩායමේ සොයුරන්ගේ මූල්‍යමය හා ද්‍රව්‍යමය අනුග්‍රහකත්වයෙන් හැටන්, තලවකැලේ හා ආරච්චිකට්ටුව ප්‍රදේශ වල අසරණ වූ ජනතාවට රෙදි පිලි හා සනීපාරක්ෂිත ද්‍රව්‍ය බෙදා දීම.
- අප කණ්ඩායමේ මිය ගිය සොයුරන් සිහිපත් කර ඔවුන් සඳහා පිං අනුමෝදන් කරවීම පිණිස තෝරයාය දම්මඩවත්ත ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ඉදිකරන ලද පහන් ගෙය සඳහා මූල්‍ය අනුග්‍රහකත්වයක් ලබා දීම.
- අප අනු කණ්ඩායමේ සංවත්සරික මහා සභාව සහ වාර්ෂික සුහද හමුව 2025-10-04, 05 දෙදින වැඩි සාමාජික සහභාගිත්වයෙන් යුතුව යටියන්තොට Olu Ella Resort හි පැවැත්වීම.

අනුකණ්ඩායම විසින් ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ජායාරූප













99 කණ්ඩායම



සභාපති
චමින්ද කුමාර



ලේකම්
ගයාන් අබේවර්ධන



භාණ්ඩාගාරික
පුබුදු රණසිංහ

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් අනුකණ්ඩායම සිදුකල ව්‍යාපෘතීන්

- 99 කණ්ඩායමේ ක්‍රියාකාරී සාමාජික බුද්ධික ඇල්ලේපොල සොයුරා විසින් විද්‍යාලයේ පහත ව්‍යාපෘතීන් සඳහා දායකත්වය ලබාදෙන ලදී.
- වාර්ෂික මහා ක්‍රිකට් තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා වෙත රු. 250,000.00 ක් (දෙලක්ෂ පනස්දහසක්) වටිනා තෑග ලබාදීම.
- වාර්ෂික මහා ක්‍රිකට් තරඟාවලියේ තුන්දින තරඟය සඳහා රු.121,000.00 ක (එක්ලක්ෂ විසිඑක්දහසක) වියදමින් අවශ්‍ය ආහාරපාන ලබාදීම.
- වාර්ෂික මහා ක්‍රිකට් තරඟාවලියේ අවසන් පුහුණුවීම් දින සඳහා රු. 25,000.00 ක (විසිපන්දහසක) වියදමින් කණ්ඩායමට අවශ්‍ය ආහාරපාන ලබාදීම.

මලියදේව විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අනුකණ්ඩායම සිදු කළ ව්‍යාපෘතීන්

- මලියදේව ආදිශිෂ්‍ය සංගමය විසින් සිදුකළ "Quadrafest" සංගීත වැඩසටහන සඳහා රු.120,000.00 ක (එක්ලක්ෂ විසිදහසක) වටිනාකමකින් යුත් ප්‍රවේශපත් අලෙවි කිරීමට දායක වීම.
- දිට්වා සුළි කුණාටුවෙන් අවතැන් වූ ජනතාව උදෙසා වියළි ආහාර ලබාදීම වෙනුවෙන් මලියදේව ආදි ශිෂ්‍ය සංගමය විසින් ක්‍රියාත්මක කළ ''මලිදෙව් සහන යාත්‍රා'' වැඩසටහන සඳහා රු. 217,000.00 ක (දෙලක්ෂ දහහත්දහසක) මූල්‍ය දායකත්වයක් හා රු.250,000.00 ක් (දෙලක්ෂ පනස්දහසක්) වටිනා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම.
- "DEVANS NIGHT" වැඩසටහන සඳහා 99 කණ්ඩායමේ ක්‍රියාකාරී සාමාජික බුද්ධික ඇල්ලේපොල සොයුරා විසින් රු. 50,000.00 ක (පනස්දහසක) මූල්‍ය දායකත්වයක් ලබාදීම.
- 99 කණ්ඩායමේ සාමාජිකයින් 05 දෙනෙකු ආදිශිෂ්‍ය මව් සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින් වන අතර පසුගිය වර්ෂය තුළ විද්‍යාලයේ උන්නතිය වෙනුවෙන් ආදිශිෂ්‍ය සංගමය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන්වලදී මේ හරහා කණ්ඩායමේ සක්‍රීය දායකත්වය ලබා දී ඇත.

අනුකණ්ඩායමේ සාමාජිකයන් වෙනුවෙන් සිදුකල ව්‍යාපෘති

- අප කණ්ඩායමේ වාර්ෂික සුහද හමුව සාමාජිකයින් 90 කගේ සහභාගිත්වයෙන් නුවරඑළිය අරලිය හෝටල් පරිශ්‍රයේදී ඉතාමත් සාර්ථක අයුරින් පවත්වන ලදී.
- කණ්ඩායමේ සාමාජිකයෙකුගේ/සාමාජිකයාගේ පවුලේ සාමාජිකයෙකුගේ/ සාමාජිකයාගේ මවගේ, පියාගේ අභාවයකදී අවමංගල්‍ය කටයුතු හා දානමය කටයුතු වෙනුවෙන් මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ අනුව පසුගිය වර්ෂයේ දී සාමාජිකයන් 12 දෙනෙකු සඳහා ඔවුන්ගේ මව හෝ පියාගේ අභාවයන් වෙනුවෙන් රු. 676,000.00 ක් (හයලක්ෂ හැත්තෑහය දහසක්) මූල්‍යාධාර වශයෙන් ලබා දී ඇති අතර අප කණ්ඩායමේ සාමාජික ප්‍රියාල් හේරත් සහෝදරයාගේ හදිසි අභාවය සිදු වූ අවස්ථාවේදී ද ඒ වෙනුවෙන් රු. 170,000.00 ක් (එක්ලක්ෂ හැත්තෑදහසක්) මූල්‍යාධාර වශයෙන් ලබා දී ඇත.

අනුකණ්ඩායම් වාර්තා

- 99 කණ්ඩායමේ සොහොයුරෙකුගේ දැනට අප විද්‍යාලයේ 13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන වැඩිමහල් පුත්‍රයාගේ හදිසි ශල්‍යකර්මයක් වෙනුවෙන් කණ්ඩායම විසින් රු. 2,355,000.00 ක (විසිතුන් ලක්ෂ පනස්පන්දහසක) මූල්‍යමය පරිත්‍යාගයක් සිදුකරන ලදී.
- 99 කණ්ඩායමේ සොහොයුරෙකු හදිසි හෘද රෝග තත්වයකට ලක් වූ අවස්ථාවේදී ඔහුගේ හදිසි සැත්කම වෙනුවෙන් කණ්ඩායම විසින් රු. 444,000.00 ක (හාරලක්ෂ හතලිස්හතර දහසක) මූල්‍යමය පරිත්‍යාගයක් සිදුකරන ලදී.
- 99 කණ්ඩායමේ සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ රෝග නිශ්චය කිරීමේ හා සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීමේ වෛද්‍ය සායනයක් 2026.03.03 දින ආදිශිෂ්‍ය සංගම් ශ්‍රවනාගාරයේදී පවත්වන ලද අතර අප කණ්ඩායමේ විශේෂඥ වෛද්‍යවරුන් 04 දෙනෙකු ඇතුළුව 06 දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය කණ්ඩායමක් විසින් රු. 266,941.00 ක (දෙලක්ෂ හැටහයදහස් නවසිය හතලිස් එකක) මූල්‍ය පිරිවැයක් දරමින් මෙම සායනය ඉතා සාර්ථකව පවත්වන ලදී.
- 2026 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් 99 කණ්ඩායමේ පවුල්වල සාමාජිකයන්ගේ ද සහභාගිත්වයෙන් අලුත් අවුරුදු උත්සවයක් 2026.04.11 දින පවත්වන ලද අතර, පවුල්වල සාමාජිකයන් ඇතුළුව 166 දෙනෙකුගේ සහභාගිත්වයෙන් රු. 401,000.00 ක (හාරලක්ෂ එක්දහසක) මූල්‍ය පිරිවැයක් දරමින් මෙම වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.
- 99 කණ්ඩායමේ සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් අනු කණ්ඩායමට අනුබද්ධව සුබසාධක සංගමයක් පිහිටුවා ඇත. ප්‍රධාන වශයෙන් කණ්ඩායමේ සාමාජිකයෙකුගේ / සාමාජිකයාගේ පවුලේ සාමාජිකයෙකුගේ / සාමාජිකයාගේ මවගේ, පියාගේ අභාවයක දී අවමංගල්‍ය කටයුතු හා දානමය කටයුතු වෙනුවෙන් මූල්‍යාධාර ලබාදීම, බැනර් ප්‍රදර්ශනය හා කණ්ඩායම වෙනුවෙන් සිදුකරනු ලබන අනෙකුත් සුබසාධන ව්‍යාපෘති අනු කණ්ඩායමේ නිලධාරී මණ්ඩලයේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ ඊට අනුබද්ධ සුබසාධක සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

පසුගිය වර්ෂයේ 99 කණ්ඩායමේ මියගිය සහෝදරයින්

- ප්‍රියාල් බුවනෙක හේරත්

අනුකණ්ඩායම විසින් ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ඡායාරූප















අනුකණ්ඩායම් වාර්තා

2005 කණ්ඩායම



සභාපති
ඉෂාර අබේසිංහ



ලේකම්
ජනක මැදවල



භාණ්ඩාගාරික
කිත්සිරි සියඹලන්ගමුව

මලියදේව විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අනුකණ්ඩායම් සිදු කල ව්‍යාපෘති

- 2025 වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා 500ml ජල බෝතල් 500 ලබා දීම.
- ශ්‍රී සර්වඥ ධාතු ප්‍රදර්ශනය සඳහා 500ml ජල බෝතල් 500 ලබා දීම.
- විද්‍යාලීය මළල ක්‍රීඩකයන් සඳහා බර ඉසිලීමේ කට්ටලයක්, උස පැනීමේ මෙට්ට සඳහා කවරයන්, ඇතුලු ක්‍රීඩා උපකරණ ලබා දීම.
- විද්‍යාලයීය තාක්ෂණ අංශය සඳහා රු. ලක්ෂ 5 මුදල් ආදි ශිෂ්‍ය සංගමයට බාර කිරීම.
- 1 ශ්‍රේණියේ දරුවන් සඳහා පවත්වනු ලබන ඉංග්‍රීසි භාෂා වැඩසටහන සඳහා රු.ලක්ෂයක මුදලක් ආදි ශිෂ්‍ය සංගමයට බාර කිරීම.
- වෙසක් පොහොය නිමිත්තෙන් 2025 වර්ෂයේ දී සුපුරුදු පරිදි අයිස්ක්‍රීම් දන්සල පැවැත්වීම.
- 2026 වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ අවසන් දින තරඟ සඳහා සහභාගී වූ ක්‍රීඩකයන් සඳහා ක්‍රීඩා ඇඳුම (ස්කිනිස්) සඳහා රු.86,000.00 මුදලක් ආදි ශිෂ්‍ය සංගමයට බාර කිරීම.
- Devans Night 2026 සඳහා රු. ලක්ෂයක මුදලක් ආදි ශිෂ්‍ය සංගමයට බාර කිරීම.
- වෙඩ් තැබීමේ ක්‍රීඩාපිටිය අලුත්වැඩියා කටයුතු සඳහා රු.25,000.00 මුදලක් ආදි ශිෂ්‍ය සංගමයට බාර කිරීම.
- තාක්ෂණික අංශයේ ගුණාත්මක බව සංවර්ධනය කිරීම සඳහා Dual Power Supply මිලදී ගැනීම සඳහා රු.40,000.00 මුදලක් ලබා දීම.
- විද්‍යාලයීය ප්‍රාථමික අංශය සහ තාක්ෂණ අංශය සඳහා නැවත ආරෝපණය කළ හැකි Buffles 02ක් ලබා දීම.
- විද්‍යාලයීය දරුවන්ගේ ජයග්‍රහණ සහිත බැනර් ප්‍රදර්ශනය සඳහා ස්ථිර බැනර් රැඳවුමක් ප්‍රධාන ගේට්ටුව අසල ස්ථාපනය කිරීම. (එක්ලක්ෂ පහලොස් දහසක්)
- විද්‍යාලයීය අවශ්‍යතා සඳහා රුපියල් ලක්ෂ 30 වටිනාකමකින් යුතු Digital Screen (අඩි 12 x 6) ප්‍රධාන ශාලාව ඉදිරිපස ස්ථාපනය කිරීම.
- කුරුණෑගල ශික්ෂණ රෝහල් පිළිකා ඒකකය සඳහා ලක්ෂ 6 උපකරණ හා භාණ්ඩ ලබා දීම.
- දිට්වා ආපදාව සමඟ අවතැන් වූ ඉඳුල්ගොඩකන්ද ශ්‍රී නිශ්ශංක ජාතික පාසලේ දරුවන් 200 සඳහා පාවහන් සහ පාසල් බෑග් ලබා දීම.
- 17.18,19 කරුණු ඉටු කර ගැනීම සඳහා ''ආලේ මන්ත්‍ර'' සංගීත ප්‍රසංගය පැවැත්වීම.

අනුකණ්ඩායම් වාර්තා

2006 කණ්ඩායම



සභාපති
ළහිරු ගුරුගේ



ලේකම්
කණිෂ්ක මදුරාගොඩ



භාණ්ඩාගාරික
හර්ෂ ගමගේ

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවන් අනුකණ්ඩායම සිදුකළ ව්‍යාපෘතීන්

- වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය වෙනුවෙන් මෙවරද නොකඩවා 14 වන වරටත් වටිනා කේක් ත්‍යාගයක් ප්‍රදානය කල අතර අප සහෝදරයන්ගේ සහභාගිත්වය මෙවරද සංවිධාන කටයුතු සඳහා හිමිවිය.
- විදුහල් ක්‍රීඩා පිටිය හා අවට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GRO)
  - මලියදේව විද්‍යාලයීය දරුවන්ගේ ක්‍රීඩා හා අමතර ක්‍රියාකාරකම් සඳහා අත්‍යවශ්‍ය වූ විදුහල් ක්‍රීඩා පිටිය පසුගිය කාලය තුළ දැඩි ලෙස භාවිතයට නුසුදුසු තත්ත්වයකට පත්ව තිබුණි. වර්ෂා ජලය රැඳී සිටීම මඩ වීම, කාණු පද්ධතිය විනාශ වීම සහ පිහිණුම් තටාකයේ පිටාර ජලය ක්‍රීඩා පිටියට පැමිණීම මේ සඳහා ප්‍රධාන හේතු ලෙස හඳුනාගෙන තිබුණි.
  - මෙම ගැටලුවට ස්ථිර විසඳුමක් ලබාදීමේ අරමුණින් මලියදේව විද්‍යාලයීය ආදී ශිෂ්‍ය 2006 අනු කණ්ඩායම විසින් විදුහල් ක්‍රීඩා පිටිය හා අවට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GRO) ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් ලක්ෂ 42 ක් ලෙස නියම කර තිබුණි.

මලියදේව විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අනුකණ්ඩායම සිදුකල ව්‍යාපෘතීන්

<u>ව්‍යාපෘතියේ අරමුණු</u>

- දරුවන්ට ආරක්ෂිත හා නිරෝගී ක්‍රීඩා පරිසරයක් සකස් කිරීම.
- වර්ෂා ජලය රැඳී සිටීම හා මඩ වීම සම්පූර්ණයෙන්ම අවම කිරීම.
- විදුහල් ක්‍රීඩාංගනය නැවත සක්‍රීය කිරීම හා දීර්ඝකාලීන විසඳුම් ලබාදීම.

<u>ක්‍රියාත්මක කළ ප්‍රධාන කටයුතු</u>

- පස් පුරවා ක්‍රීඩා පිටිය ජලය නොරැඳෙන පරිදි නිසි මට්ටමකට සකස් කිරීම.
- විනාශ වී තිබූ අවට කාණු පද්ධතිය නැවත ඉදිකිරීම.
- ක්‍රීඩා පිටිය අසල ඇවිදින මංපෙත අළුත්වැඩියා කිරීම.
- පිහිණුම් තටාකයේ පිටාර ජලය ක්‍රමවත්ව බැහැර කිරීම.
- දරුවන්ට භාවිත කළ හැකි එළිමහන් පන්ති කාමරයක් ඉදිකිරීම.
- ගෘහස්ත ක්‍රීඩාංගනය අවට පරිසරය පිරිසිදු කර, පස් පුරවා ආරක්ෂිත හා සුන්දර වටපිටාවක් සකස් කිරීම.

- වාර්ෂික මහා ක්‍රිකට් තරගයේ සංවිධාන කටයුතු සඳහා මෙවරත් අප සහෝදරයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය මෙන්ම ක්‍රියාකාරී ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී
- පාසලේ ක්‍රිකට් ක්‍රීඩාව වැඩි දියුණු කිරීමේ අරමුණ පෙරදැරිව පාසලේ ක්‍රිකට් පුහුණු වීමට අත්‍යවශ්‍ය සුදු පැහැති නියමිත ප්‍රමිතියෙන් යුතු රුපියල් 250,000 වටිනා කොකබුරා ලෙදර් පන්දු 10ක් ප්‍රදානය කරුණු ලැබිණ.
- සිසු දරුවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය වැඩි දියුණු කිරීමේ අරමුණෙන් සහ ව්‍යාපෘතියට සමගාමීව 6-7 පන්ති දරුවන් සඳහා වටිනා ක්‍රීඩා උපකරණ කට්ටලයක් ලබා දීම සිදුකරන ලදී.


මලියදේව විද්‍යාලීය ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අනුකණ්ඩායම සිදු කළ ව්‍යාපෘතීන්

- මුදල් අනුකමිටුව මගින් අරමුදල් රැස්කිරීම වෙනුවෙන් සංවිධානය කරන ලද “quadrafest by devans 2026” ප්‍රසංගය වෙනුවෙන් රු. 150,000 ක් වටිනා ටිකට්පත් අප අනුකණ්ඩායම විසින් මිලදීගත් අතර ප්‍රසංගය සාර්ථක කරගැනීම සඳහා කණ්ඩායම් සාමාජිකයන්ගේ ශ්‍රම දායකත්වය සංවිධාන කටයුතු වෙනුවෙන් හිමි විය. තවද අප කණ්ඩායමේ එරන්ග යාපා සහෝදරයා මෙම වැඩසටහන සංවිධානය කිරීමේදී මුදල් අනු කමිටුවේ උප සභාපතිවරයෙකු ලෙස සංවිධාන කටයුතු මෙහෙයවනු ලැබිනි.
- 2025 ජනවාරි මස 18 වන දින පැවති Old Devans cricket carnival 2026 තරගාවලිය සඳහා රු 25,000 ක් වටිනා මූල්‍යමය අනුග්‍රහයක් ලබා දුන් අතර 10 x 10 VIP hut එකක් සඳහා රු. 2,500 වටිනා මූල්‍යමය දායකත්වයක් දක්වන ලදී. මේ සඳහා අප සහෝදරයින්ගේ සහභාගිත්වය ලැබුනු අතර තරගාවලියේ අවසන් වට දක්වා ක්‍රීඩා කරන ලදී.
- 2026 මාර්තු 29 දින පැවති Devans Night 2026 වැඩසටහන සඳහා අප කණ්ඩායමේ සහෝදරයින්ගේ ශ්‍රම දායකත්වය මේ සඳහා ලබා දෙනු ලැබිනි. පසු ගිය වසර වලදී මෙන්ම මෙවරද වැඩිම සහභාගිත්වය අප කණ්ඩායමෙන් සිදු කරන ලදී.
- මලියදේව විද්‍යාලයීය සුභසාධක සංගමය මගින් සංවිධානය කරන ලද වාර්ෂික අවුරුදු උත්සවය සඳහා අප සහෝදරයින්ගේ ශ්‍රම දායකත්වය මෙන්ම සහභාගිත්වයද සිදුවිය.
- මලියදේව විද්‍යාලයීය සුභසාධක සංගමය මගින් සංවිධානය කරන ලද ආදී මලියදේව සහන යාත්‍රා වැඩසටහන සඳහා ද්‍රව්‍ය රැස්කිරීමට, ද්‍රව්‍ය ලබාදීමට මෙන්ම ද්‍රව්‍ය බෙදා දීම සඳහා අප කණ්ඩායමේ සහෝදරයින් ක්‍රියාශීලීව සහයෝගය ලබා දෙන ලදී.

අනුකණ්ඩායම සිදු කළ වෙනත් වැදගත් ව්‍යාපෘතීන්

- අනුකණ්ඩායමේ සාමාජික මහත්වරුන්තේ පවුල්වල සාමාජිකයන්ගේ අභාවයන්හිදී සහ අනෙකුත් විශේෂ අවස්ථාවලදීත් අනුකණ්ඩායමේ සුභසාධන කටයුතු මෙම වසරේදීත් අඛණ්ඩව කමිටු සාමාජිකයන්ගේ අනුග්‍රහයන් කරගෙන යනලදී.
- අප කණ්ඩායමේ වාර්ෂික සුහද හමුව කණ්ඩායම් ප්‍රධාන ව්‍යපෘතියට සමගාමීව සාමාජිකයින් හැත්තෑවකට අධික සහභාගිත්වයක් සහිතව ව්‍යාපෘති පරිශ්‍රයේදී උත්කර්ශවත් ලෙස පැවැත්වූ අතර මෙහිදීද කණ්ඩායමේ ප්‍රධාන ඉලක්කය සඳහා සහෝදරයින්ගේ ඉහල ම දිරිගැන්වීම් ලැබුන අතර අතීත මතක සටහන් ඉතා සංවේදී ලෙස සිහිපත් කරනු ලැබින.

අනුකණ්ඩායම විසින් ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ඡායාරූප







අනුකණ්ඩායම් වාර්තා









MALIYADEVA
SPORT MEET 2026
2006 GROUP

MALIYADEVA

DEVANS
NIGHT
2026


QUADRAFEST

අනුකණ්ඩායම් වාර්තා

2007 කණ්ඩායම



සභාපති
තාරක චන්ද්‍රසේකර



ලේකම්
දසිත් ලංසකාර



භාණ්ඩාගාරික
දුලීෂ කසුන්

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් අනුකණ්ඩායම කළ ව්‍යාපෘති

- අප විදුහලේ ප්‍රාථමික අංශයේ දරුවන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ අරමුණෙන් ඉදිකරන ලද Smart English Learning Centre and Smart Library වෙනුවෙන් රු.75,000.00ක් වටිනා බීන් බෑගස් (ආසන) ලබාදීම.
- විද්‍යාලීය නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය සඳහා රු.25,000.00 ක මුදලක් වැයකර කුසලාන ලබාදීම සහ කේක් ත්‍යාගයක් ලබාදීම.

මලියදේව විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අනුකණ්ඩායම සිදු කළ ව්‍යාපෘති

- දේවන්ස් රාත්‍රිය සඳහා ටිකට් පත් 20ක් 2007 කණ්ඩායමේ සාමාජිකයන් අතර අලෙවි කිරීම හා කණ්ඩායම් සාමාජිකයින්ගේ දායකත්වයෙන් රු. 550,000.00 ක වටිනාකමකින් යුත් මූල්‍යමය අනුග්‍රාහකත්වයක් ලබාදීම.

අනුකණ්ඩායම විසින් සිදු කළ වෙනත් වැදගත් ව්‍යාපෘති

- අප කණ්ඩායම විසින් සෑම අවුරුද්දකම සිදුකරනු ලබන, අප කණ්ඩායම විසින් ආරම්භ කරනු ලැබූ මුල්ම ව්‍යාපෘතිය වන පොසොන් පෝය වෙනුවෙන් කරණු ලබන අයිස් ක්‍රීම් දන්සැල ඉතා සාර්ථක ලෙස සිදුකිරීම.
- දිට්වා ව්‍යසනය හමුවේ මව් සංගමය විසින් සිදුකරල ලද ව්‍යාපෘතියට සමගාමීව රු 150,000.00 ක වටිනාකමකින් යුත් වියලි සලාක ඇතුලු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රිදීගම ප්‍රදේශයේ අවතැන් වූ පවුල් වලට ලබාදීම.

අනුකණ්ඩායම් වාර්තා

2008 කණ්ඩායම



සභාපති
H.M.S.M.B. **හේරත්**



ලේකම්
W.P.P.N. **ජයසිංහ**



භාණ්ඩාගාරික
ගයාන් මුණසිංහ

වැඩසටහනේ නම	ක්‍රියාත්මක කළ දිනය	මූල්‍ය ප්‍රතිපාදනයේ වටිනාකම	වැඩසටහනේ අරමුණු	සම්බන්ධීකාරක	අමතර විස්තර
''දිට්වා'' සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාවට ආධාර ලබා දීම.	2025 නොවැම්බර් 30	250000/-	සමාජ සුබසාධනය	චතුරංග වික්‍රම ආරච්චි	අප කණ්ඩායමේ සහෝදරයන් විසින් එකතු කළ මුදලින් වියළි ආහාර, ඖෂධ, ඇඳුම් ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය විපතට පත් අයට ලබා දීමට කටයුතු කරන ලදී.
වේදිකා නාට්‍ය ප්‍රදර්ශනය (අටවන බුවනෙක)	2025-2026 වර්ෂය	600000/-	අනු කණ්ඩායමේ අරමුදල වර්ධනය කර ගැනීම සහ ඉදිරි වැඩසටහන් සඳහා අරමුදල් සම්පාදනය	මිහිරාන් හේරත්	වේදිකා නාට්‍ය ප්‍රදර්ශනයට අවශ්‍ය අරමුදල් සම්පාදනය අප කණ්ඩායමේ සහෝදරයන්ගේ මූල්‍ය දායකත්වයෙන් සහ ටිකට් පත් අලෙවියෙන් සිදු කරන ලද අතර කණ්ඩායමේ බොහෝ පිරිසක් සහභාගි විය.
2008 අපේ අවුරුදු උත්සවය	2026 අප්‍රේල් 26	125000/-	කණ්ඩායමේ සාමාජිකයින් සහ පවුල්වල සාමාජිකයන් අතර සුහදතාවය වර්ධනය කර ගැනීම	මිහිරාන් හේරත්, චතුරංග වික්‍රම ආරච්චි	2008 කණ්ඩායමේ සහෝදරයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් 50 කට ආසන්න පිරිසක් මේ සඳහා සහභාගී වූහ.

2008 අනු කණ්ඩායමේ වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය	2026 ජූලි 12	70000/-	කණ්ඩායමේ සාමාජිකයින් අතර සුහදතාවය වර්ධනය කර ගැනීම	බී.පී. බණ්ඩාර ෆ්‍රැන්සිස්කෝ	2008 මලියදේව අනු කණ්ඩායම සහ ශාන්ත ආනා ආදි ශිෂ්‍යයන් 2008 අතර විද්‍යාලීය අනුකණ්ඩායම ක්‍රිකට් තරඟාවලිය
2008 මලියදේව අනු කණ්ඩායම සහ ශාන්ත ආනා ආදි ශිෂ්‍යයන් 2008 අතර විද්‍යාලීය අනුකණ්ඩායම ක්‍රිකට් තරඟාවලිය	2026 ජූලි 26	80000/-	සහෝදර පාසලේ සහ 2008 ආදි ශිෂ්‍යයන් අතර මිත්‍රත්වය වැඩි දියුණු කර ගැනීම	චතුරංග වික්‍රම ආරච්චි	
විශ්‍රාමික සහ සේවයේ නියුතු ගුරු භවතුන් සඳහා වන වාර්ෂික වෛද්‍ය කඳවුර	2026 අගෝස්තු 02	432000/-	පාසල මව් ආදි ශිෂ්‍ය සංගමය සහ 2008 අනු කණ්ඩායම අතර සහයෝගිතා වර්ධනය කර පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් වැඩසටහන සිදු කිරීම.	වෛද්‍ය දසුන් වාසල, වෛද්‍ය ලාහිම සේනානායක, මිහිරාන් හේරත්, බී.පී. බණ්ඩාර	අප කණ්ඩායමේ වෛද්‍ය සහෝදරයින්ගේ මූලිකත්වයෙන් වාර්ෂිකව සංවිධානය කරන වෛද්‍ය කඳවුර ඉතා සාර්ථකව පැවැත්වීමට හැකි විය. ඒ සඳහා විශ්‍රාමික සහ සේවයේ නියුතු ගුරුභවතුන් 100කට ආසන්න පිරිසක් සහභාගි විය.

මලියදේව විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් අනුකණ්ඩායම් සිදු කල ව්‍යාපෘති

- මලියදේව විද්‍යාලයේ අභිවෘධිය වෙනුවෙන් 2008 අනුකණ්ඩායම විසින් සිදු කළ ව්‍යාපෘතීන් විශ්‍රාමික සහ සේවයේ නියුතු ගුරු මෑණිවරුන් සඳහා සංවිධානය කරන ලද වාර්ෂික වෛද්‍ය කඳවුර 2026 අගෝස්තු 02 වන දින විද්‍යාල ආදි ශිෂ්‍ය සංගම් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එහිදී ගුරු මෑණිවරුන්ට පියවරුන්ට අවශ්‍ය සියළුම වෛද්‍ය උපදේශන සේවාවන්, අක්ෂි සායන සහ රෝග පරීක්ෂාවන් අප ආදි ශිෂ්‍ය සහෝදර වෛද්‍යවරුන් සම්බන්ධ වී සිදු කර දෙන ලදී.

මලියදේව විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමය වෙනුවෙන් ක්‍රියාකාරී අනු කණ්ඩායමක් වශයෙන් දැක්වූ දායකත්වය

- ''දිට්වා'' ස්වාභාවික ව්‍යසනයෙන් විපතට පත් වූ ජනතාවට සහන සැලසීම වෙනුවෙන් අත්‍යවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම.
- මලිදෙව් Cricket Carnival තරඟාවලියට මූල්‍ය අනුග්‍රහයක් (රු.25,000) ලබා දීම සහ ඒ වෙනුවෙන් 2008 අනු කණ්ඩායමෙන් කණ්ඩායම් (Teams) 03ක් ඉදිරිපත් කිරීම.
